සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

**45 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

**1.** භාරතීය සමාජයේ කුලවාදය තහවුරු කිරීම සඳහා බ්‍රාහ්මණයන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධානතම ආගමික ඉගැන්වීම වූයේ,

(1) වර්ණ ධර්ම සංකල්පයයි. (2) ස්ව ධර්ම සංකල්පයයි.
(3) ආශ්‍රම ධර්ම සංකල්පයයි. (4) ආපද් ධර්ම සංකල්පයයි.
(5) යාග සංකල්පයයි.

**2.** වානප්‍රස්ථ ආශ්‍රමයේදී කළ යුතු ප්‍රධාන කාර්යය වූයේ,

(1) වේද අධ්‍යයනයයි. (2) කම්සැප විඳීමයි.
(3) වනගතව තවුස්දම් පිරීමයි. (4) යාග කර්ම කිරීමයි.
(5) සංචාරක ජීවිතයක් ගත කිරීමයි.

**3.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් බුද්ධකාලීන භාරතීය කාන්තාව පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අදාළ වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ස්වාමියා මළ පසු භාර්යාව සති පූජාව පැවැත්වීම අනිවාර්ය විය.
(2) කාන්තාවට ආගමික කටයුතුවලට සහභාගි වීමට හැකි වූයේ සැමියා සමග පමණි.
(3) ජීවිතාන්තය දක්වා පුරුෂාධිපත්‍යයට යටත්ව වාසය කළ යුතු ය.
(4) කාන්තාවට ප්‍රමාණවත් ආර්ථික නිදහසක් තිබී විය.
(5) විවාහයෙන් පසු පිරිමි දරුවකු බිහි කිරීම අනිවාර්ය විය.

**4.** බුද්ධකාලීන ශ්‍රමණ ගුරුකුල සතුව පැවති සුවිශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරින් ආජීවක සම්ප්‍රදායේ අනන්‍යතාව වඩාත් තහවුරු වන කරුණ ඇතුළත් වරණය තෝරන්න.

(1) පරම අවිහිංසාවාදී වීම
(2) ජටාවක් හිසේ දැරීම
(3) කෙස්වලින් සකස් කරගත් කම්බිලියක් හැඳීම
(4) එක් සළුවක් පමණක් දරා සිටීම
(5) අතෙහි දණ්ඩක් දරා සිටීම

**5.** පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ සහ ජීව යනුවෙන් ස්ථිර වූ, නො බිඳෙන, සප්ත පදාර්ථයක් ඇතැයි දක්වමින් ශාස්වතවාදී දර්ශනයක් ඉදිරිපත් කළ බුද්ධකාලීන භාරතීය ශාස්තෘවරයා කවුද?

(1) මක්ඛලී ගෝසාල (2) පකුධ කච්චායන
(3) අජිත කේසකම්බලී (4) පූරණ කස්සප
(5) නිගණ්ඨනාතපුත්ත

6. බුද්ධකාලීන භාරතයේ ක්‍රියාත්මක වූ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති කිහිපයක් පහත දැක් වේ.

A - තීරණ ගැනීමේ විධායක බලය රජු සතු විය.
B - රාජ්‍ය පාලනය ක්‍රියාත්මක වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකිනි.
C - නව නීති පැනවූයේ ප්‍රජාතාන්ත්‍රික පදනමක් මත ය.
D - මතභේදාත්මක ගැටලුවලදී වුව ද මත විමසීමකින් තොරව තීරණ ගැනීම සිදුවිය.
E - අවට රාජ්‍යයන් යටත් කර ගැනීම ප්‍රමුඛ ප්‍රතිපත්තිය විය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ගණතන්ත්‍ර පාලනයට අදාළ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ C
(4) C සහ E (5) D සහ E

7. පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගෙන් ධර්මය අසා තෙරුවන් සරණ ගිය බුද්ධකාලීන භාරතීය පාලකයා සහ ඔහුගේ රාජ්‍යය ඇතුළත් වරණය තෝරන්න.

(1) බිම්බිසාර රජු - මගධ රාජ්‍යය (2) කොසොල් රජු - කෝසල රාජ්‍යය
(3) උදේන රජු - වත්ස රාජ්‍යය (4) චණ්ඩපජ්ජෝත රජු - අවන්ති රාජ්‍යය
(5) අජාසත් රජු - මගධ රාජ්‍යය

8. බුද්ධකාලීන භාරතීය සමාජය නාගරිකරණය වීමේ ප්‍රතිඵලයක් නො වන කරුණ ඇතුළත් වරණය තෝරන්න.

(1) සුරාසල් හා ගණිකා වෘත්තිය බිහිවීම (2) නව වාණිජ ප්‍රජාවක් බිහිවීම
(3) වෙළඳ නගර නිර්මාණය වීම (4) යුද ගැටුම් වර්ධනය වීම
(5) නගර ආශ්‍රිත ජනගහන වර්ධනය සීමා වීම

9. සිවුසස් සිය නැණින්
දැන දැන්විය කුලුණින්
දුරලයි අනුවණින්
............................... ............

යනාදි පද්‍යයෙන් කියැවෙන්නේ බුදුරජාණන් වහන්සේ සතුව පැවති කිනම් ගුණය ද?

(1) සම්මාසම්බුද්ධ (2) සුගත (3) ලෝකවිදූ (4) බුද්ධ (5) භගවා

10. බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනයේදී විවිධ ක්‍රම ශිල්ප අනුගමනය කළ බව බුද්ධ චරිතය තුළින් ප්‍රකට වේ. එසිලා රාහුලෝවාද සහ කසීභාරද්වාජ යන සූත්‍රවලින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ ........................ භාවිත කළ බව ය.

(1) උපමානුසාරී දේශනා ක්‍රමය (2) සෘජු දේශනා ක්‍රමය
(3) ප්‍රශ්නෝත්තර ක්‍රමය (4) පැවරුම් ක්‍රමය
(5) සාකච්ඡා ක්‍රමය

11. බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ප්‍රකට වන සුවිශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක් වේ.

A - කේසපුත්ත නියම් ගම්වැසි කාලාමයන්ට විමර්ශනශීලීව තීරණ ගැනීමට අනුශාසනා කිරීම
B - කෝපවන්නන් හමුවේ කෝප නො වීම සහ කෙලෙස්වලින් ආතුරවූවන් අතර අනාතුරව සිටීම
C - විවිධ පුද්ගලයන් විසින් සිදුකරන ලද ආක්‍රෝශ පරිභව හමුවේ අකම්පිතව සිටීම
D - තමන් වහන්සේ පිළිබඳව වුව ද විමසා බැලීමෙන් පසු පිළිගැනීමට මග පෙන්වීම
E - දැඩි නීතිරීති මගින් සිය ශ්‍රාවකයන් පාලනය කිරීමට උත්සාහ නො කිරීම

ඉහත කරුණු අතුරින් බුදුරජාණන් වහන්සේ චින්තන නිදහස අගය කළ බව ප්‍රකට වන ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) A සහ E පමණි. (5) B සහ C පමණි.

12. "නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහමයි" මෙම ප්‍රකාශය කවරෙකු විසින් කරන ලද්දක් ද?

(1) එඩ්වින් ආර්නෝල්ඩ් (2) ඇල්බට් අයින්ස්ටයින් (3) බර්ට්‍රන්ඩ් රසල්
(4) ලක්ෂ්මී නරසු (5) මැක්ස් මුලර්

13. බුද්ධකාලීන ශ්‍රාවකයන් වහන්සේලා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A - සූකරඛත ලෙණෙහිදී 'දීඝනඛ' පරිබ්‍රාජකයාට දේශනා කළ වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත් විය.

B - බුදුරජාණන් වහන්සේගේ දකුණේ සවු තනතුර ලැබූහ.

C - බුදුරජාණන් වහන්සේගේ වමත් සවු තනතුර ලැබූහ.

D - භික්ෂුණී ශාසනය පිහිටුවීමට පුරෝගාමීව කටයුතු කළහ.

E - ශ්‍රී සද්ධර්මය මැනවින් මතක තබාගැනීම නිසා ධර්ම සේනාපති තනතුර ලැබූහ.

ඉහත ප්‍රකාශ අතුරින් සැරියුත් මහරහතන් වහන්සේගේ චරිතය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B සහ D (2) A, B සහ E (3) A, C සහ E
(4) B, D සහ E (5) C, D සහ E

14. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය සඳහන් වන දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි එන විවරණයට අනුව නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

(1) කෙත්වතුවල පාලනය වෛශ්‍ය වංශිකයන්ගේ වගකීමක් විය.
(2) ග්‍රන්ථ ඉගෙනීමට ප්‍රියවූවෝ වනගත ජීවිතයක් ගත කළහ.
(3) විවිධ වූ කර්මාන්තයන්හි නිරතවූවන් ක්ෂත්‍රිය නම් විය.
(4) පව් බැහැර කිරීමේ අදහසින් වනගතවූවෝ අන්‍යයන් ද පවින් වැළැක්වීමට ක්‍රියා කළහ.
(5) පහත් ඇවතුම් පැවතුම් සහිත වූවන් ශුද්‍ර නම් විය.

15. ලෝක පාලක ධර්ම යන්නෙන් අදහස් කරනුයේ,

(1) රාජ්‍ය ව්‍යවස්ථාවයි. (2) වැරදිකරුවන්ට දඬුවම් දීමයි.
(3) නීති රීති ක්‍රියාත්මක කිරීමයි. (4) පව් කිරීමට ලැජ්ජා-බිය වීමයි.
(5) අපරාධ සිදුවීමට ඇති අවස්ථා වළක්වාලීමයි.

16. බෞද්ධ දේශපාලන චින්තනයට අනුව ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක් පවත්නා රාජ්‍යයක රටවැසියන්ගේ වගකීමක් ලෙස නො සැලකිය හැක්කේ,

(1) නීති රීති කඩ නො කොට ආරක්ෂා කිරීමයි.
(2) ජනතා පරමාධිපත්‍යයට අනුව රාජ්‍ය පාලකයා පත්කර ගැනීමයි.
(3) රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීමයි.
(4) නිසි පරිදි රජයට බදු ගෙවීමයි.
(5) අරගල මගින් අධාර්මික පාලකයන් පළවා හැරීමට කටයුතු කිරීමයි.

17. බෞද්ධ දේශපාලන මූලධර්ම ඇතුළත් ප්‍රධාන මූලාශ්‍රයක් වන කූටදන්ත සූත්‍රාගත ඉගැන්වීම්වලට අයත් නො වන පාලන ප්‍රතිපත්තියක් වන්නේ,

(1) රට තුළ ආර්ථික සමෘද්ධිය ඇති කිරීමයි. (2) අපරාධ ඇති වීමට ඉඩ නො තැබීමයි.
(3) දිළිඳුකම නැති කිරීමට ක්‍රියා කිරීමයි. (4) වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීමයි.
(5) රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමයි.

18. මිනිසාට සිය ජීවිතය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ධනයක් නොමැති වීම සමාජ ගැටලු නිර්මාණය වීමට ඉවහල් වන බව බුදුසමය පෙන්වා දෙයි. ඒ අනුව චක්කවත්තිසීහනාද සූත්‍රාගත ඉගැන්වීම්වලට අනුව දිළිඳුකම පාදක කොටගෙන ක්‍රමිකව සිදුවන විවිධ අපරාධවලට අයත් නො වන කරුණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සොරකමට පෙළඹීම (2) සූදු ක්‍රීඩාවට පෙළඹීම
(3) බොරු කීමට පෙළඹීම (4) හිංසනයට පෙළඹීම
(5) අවි ආයුධ භාවිතයට පෙළඹීම

19. සම්පත් පරිභෝජනයට අදාළ ප්‍රකාශ පහක් පහත දැක් වේ.

A - තමාගේ සුඛ විහරණය සඳහා ධනය යෙදවිය යුතු ය.

B - හිත මිතුරන්ගේ සුඛ විහරණය සඳහා ධනය යෙදවිය යුතු ය.

C - අඹු-දරුවන්ගේ සුඛ විහරණය සඳහා ධනය යෙදවිය යුතු ය.

D - මවුපියන්ගේ සුඛ විහරණය සඳහා ධනය යෙදවිය යුතු ය.

E - දැසි දස් කම්කරුවන්ගේ සුඛ විහරණය සඳහා ධනය යෙදවිය යුතු ය.

සම්පත් පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුව ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) A පමණි. (2) A සහ B පමණි. (3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි. (5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

**20.** බුදු දහම පුද්ගලයාට ධනය උපයා හැකීම සහ ධන පරිභෝජනය පිළිබඳ උපදෙස් ලබා දෙයි. ධන පරිභෝජනයේදී තමා පමණක් පරිභෝජනය කිරීම අනුමත නො කරන අතර එය සමස්ත සමාජය තුළ බෙදී යන ආකාරයට පරිහරණය කළ යුතු බව උගන්වයි. එම ඉගැන්වීම ඇතුළත් ආර්ථික මූලධර්මය හැඳින්වෙන්නේ,

(1) පංච බලි නමිනි.
(2) පරිත්‍යාගය නමිනි.
(3) සතර සංග්‍රහවස්තු නමිනි.
(4) සමජීවිකතා නමිනි.
(5) දානය නමිනි.

**21.** "මේ දහම්හු සපුරන ලද්දාහු සමාදන් කොට ගන්නා ලද්දාහු අවැඩ පිණිස දුක් පිණිස පවත්වන්නාහුයි යම් කලෙක තෙපි තුමූ ම දැනගන්නාහු නම්, එකල්හි තෙපි එය දුරු කරව් ..." යනාදි ප්‍රකාශයෙන් කියැවෙන්නේ,

(1) පව් බැහැර කිරීම පිළිබඳ දේශනාවකි.
(2) දුක් දුරු කිරීම පිළිබඳ අනුශාසනාවකි.
(3) හොඳ නරක පිළිබඳ නිර්ණායකයකි.
(4) අත්තූපනායික ධර්ම පිළිබඳ නිර්ණායකයකි.
(5) සිල් සමාදන් විය යුතු ආකාරය පිළිබඳ උපදේශයකි.

**22.** ලෝභ, ද්වේෂ සහ මෝහ යන මනෝභාවයන් පදනම් කරගෙන පුද්ගලයකු විසින් කරනු ලබන අකුසල් දහම් දස අකුසල් නමින් බෞද්ධ සාහිත්‍යයෙහි දැක් වේ. ඒවා අතුරින් මනස මූලික කොටගෙන කරනු ලබන අකුසල් දහම් අනුපිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

(1) සතුන් මැරීම, බොරු කීම සහ දැඩි ලෝභය
(2) සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම සහ දැඩි තරහව
(3) දැඩි තරහව, විෂම ලෝභය සහ මිසදිටුකම
(4) බොරු කීම, දැඩි තරහව සහ සොරකම
(5) දැඩි ලෝභය, දැඩි තරහව සහ මිසදිටුකම

**23.** බොහෝ සැප සම්පත් අපේක්ෂා නො කොට අවම පරිභෝජනයෙන් තෘප්තිමත්ව කටයුතු කිරීම බුදු දහමේ හැඳින්වෙන්නේ .............................. නමිනි.

(1) සුභරතාව
(2) අල්පේච්ඡතාව
(3) අල්ප කෘත්‍යතාව
(4) සන්තුට්ඨිතාව
(5) අතිච්ඡතාව

**24.** මිනිසා විසින් සිදුකොට ඇති පාරිසරික විනාශය වර්තමාන ලෝකයේ සියලු දෙනා පීඩාවට පත් කරන බරපතල සමාජ ගැටලුවකි. මෙම ගැටලුව අවම කර ගැනීමට අදාළ කරගත හැකි ඉගැන්වීම් රැසක් බෞද්ධ සාහිත්‍යය තුළ සඳහන්ව තිබේ. ඒ අනුව භික්ෂු ජීවිතය හා පරිසර සංරක්ෂණය අතර ඇති සබඳතාව ප්‍රකට කරන අවස්ථාවක් ලෙස .............................. දැක්විය හැකි ය.

(1) ආරාම ඉදි කිරීම
(2) වන රෝපණය කිරීම
(3) මංමාවත් ඉදි කිරීම
(4) ළිං පොකුණු තැනීම
(5) පරිසරය අපවිත්‍ර වන කිසිදු ක්‍රියාවක නො යෙදීම

**25.** විතරාගී උතුමන් වහන්සේලා සෞන්දර්ය රසාස්වාදය කළ ආකාරය ථේර-ථේරී-ගාථාවලින් තහවුරු වේ. එහිලා අජකරණී නදී තීරය බවුන් වැඩීමට තෝරා ගනිමින් එහි සුන්දරත්වය අත්විඳින ලද්දේ,

(1) සප්පක මහතෙරුන් වහන්සේ ය.
(2) වනවච්ච මහතෙරුන් වහන්සේ ය.
(3) කාලුදායී මහතෙරුන් වහන්සේ ය.
(4) ගෝධික මහතෙරුන් වහන්සේ ය.
(5) තාලපුට මහතෙරුන් වහන්සේ ය.

**26.** ධාර්මිකව ධනය ඉපැයිය යුතු මාර්ග ලෙස පශු පාලනය, වෙළඳාම, ගොවිතැන් කිරීම, රාජ්‍ය සේවය සහ විවිධ ශිල්ප කර්මාන්තයන්හි යෙදීම යනාදී වෘත්තීන් බුදුසමයෙහි දක්වා තිබේ. මෙහිදී 'මාතකුට' නමැති වංචනික ක්‍රියාවෙන් ධනය උත්පාදනය නො කළ යුතු යැයි අවධාරණය කොට ඇත්තේ,

(1) රාජ්‍ය සේවයෙනි.
(2) ගොවිතැනෙනි.
(3) වෙළඳාමෙනි.
(4) පශු පාලනයෙනි.
(5) විවිධ ශිල්ප කර්මාන්තයන්හි යෙදීමෙනි.

27. "සාර්ථක ගෘහස්ථ ජීවිතයක් ගත කරන පුද්ගලයා සම්පත් උපයාගෙන එය නිසි පරිදි පරිහරණය කරමින් සුවදායි දිවි පෙවෙතක් ගත කළ යුතු ය." යන්න බුදුසමයේ නිර්දේශයයි. තමන් උපයාගනු ලබන ධන සම්පත් නිසි පරිදි කළමනාකරණය හා සංරක්ෂණය කොට පරිභෝග කළ යුතු ය. ඒ අනුව වැය පක්ෂය අය පක්ෂයට වඩා වැඩි නො වන සේ සමතුලිතව පරිභෝජනය කළ යුතු අතර, එය හැඳින්වෙන්නේ,

(1) පංච බලි නමිනි.
(2) අජද්ධුමාරික නමිනි.
(3) උදුම්බරඛාදක නමිනි.
(4) සමජීවිකතා නමිනි.
(5) ආරක්ඛ සම්පදා නමිනි.

28. මිනිසා සුඛකාමී සත්ත්වයකු ලෙස සලකන බුදුසමය ලෞකික වූත්, ලෝකෝත්තර වූත් සැප රැසක් ඇති බව උගන්වයි. මේවා අතුරින් "අත්හැරීමේ සුවය" හඳුන්වන්නේ,

(1) සාමිස සුඛ නමිනි.
(2) නිරාමිස සුඛ නමිනි.
(3) කාම සුඛ නමිනි.
(4) නෙක්ඛම්ම සුඛ නමිනි.
(5) අනවජ්ජ සුඛ නමිනි.

29. සිගාල ගෘහපති පුත්‍රයා අරබයා දේශිත සිගාලෝවාද සූත්‍රයෙහි එන සදිසා වන්දනය තුළින් නිරූපිත අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් කිහිපයක් පහත දැක් වේ.

A - මැනවින් හික්මවීම
B - දැක හුනස්නෙන් නැගී සිටීම
C - පවින් වැළැක්වීම
D - යහපත් කටයුතුවල නිරත කරවීම
E - අවමන් නො කිරීම

ඉහත ප්‍රකාශ අතුරින් දකුණු දිසාව නියෝජනය කරන ගුරු-ශිෂ්‍ය යුතුකම් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A සහ D පමණි.
(4) B සහ D පමණි.
(5) B සහ E පමණි.

30. පුද්ගලයා උපයන ධන සම්පත් විනාශ වීමට හේතු වන සාධක හයක් සිගාලෝවාද සූත්‍රයේ, අපායමුඛවලින් විස්තර කරයි. එහි "සමජ්ජාභිචරණ" යනුවෙන් අදහස් කරනුයේ,

(1) ද්‍යූ කෙලියෙහි යෙදීමයි.
(2) නො කල්හි වීදි සංචාරය කිරීමයි.
(3) පාප මිත්‍ර සේවනයයි.
(4) රහ මෙර පානයයි.
(5) ගීත-නාට්‍ය සංදර්ශනවල ඇලීමයි.

31. ගිහි සමාජයේ අභිවෘද්ධිය සඳහා මංගල සූත්‍රයෙන් ඉගැන් වූ කරුණු අතුරින් පවුලක එදිනෙදා යහපැවැත්මට අදාළ කරගත හැකි ඉගැන්වීමක් **නො** වන්නේ,

(1) අසේවනා ච බාලානං යන්න ය.
(2) මාතා පිතු උපට්ඨානං යන්න ය.
(3) ඤාතකානං ච සංගහෝ යන්න ය.
(4) මජ්ජපානා ච සඤ්ඤමෝ යන්න ය.
(5) නිබ්බාණ සච්ඡිකිරියා ච යන්න ය.

32. අචරිත්වා බ්‍රහ්මචරියං
අලද්ධා යොබ්බනේ ධනං
ජිණ්ණ කොඤ්චාව ඣායන්ති
ඛීණ මච්ඡේව පල්ලලේ

මෙම ධම්ම පද ගාථාවෙන් පෙන්වා දෙන පරිදි දිය සිඳී ගිය, මසුන් නොමැති විලක් දෙස දුකින් බලා සිටින මහලු කොස්වාලිහිණියකුට සමාන වන්නේ,

(1) තරුණ කල බ්‍රහ්මචර්යාව නො රැක, ධනය නො ලබා, තැවෙන වයස්ගත ගිහියන් ය.
(2) දරුවන්ගේ ආදර සැලකිලි නො ලබා දුකින් සිටින වයස්ගත දෙමවුපියන් ය.
(3) බ්‍රහ්ම චරියාව නො රැක මහලු වියට පත්ව තැවෙන ගිහියන් ය.
(4) සතර අගතියට හසු වී නිසි පරිදි මහජන සේවය නො කළ විශ්‍රාමික රාජ්‍ය සේවකයන් ය.
(5) ධූර්ත තත්ත්වයන්ට අබ්බැහි වී ධනය විනාශ කරගත් පුද්ගලයන් ය.

33. පරාභව සූත්‍රයට අනුව පහත සඳහන් හේතු අතුරින් පුද්ගලයාගේ පිරිහීමට හේතු නොවන කරුණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) අලසව කටයුතු කිරීම
(2) තමන් සතු සම්පත් අනුන් සමඟ බෙදා හදා ගැනීම
(3) මහලු දෙමවුපියන්ට නො සැලකීම
(4) අසත්පුරුෂ ධර්ම ප්‍රිය කිරීම
(5) මානය කරණකොට සිය ඥාතීන් පහත්කොට සැලකීම

34. ස්වකීය ශ්‍රාවකයන් වහන්සේලා ධර්මදූත සේවාවන්හි යෙදවූ බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේ ද ධර්මදූත සේවාවෙහි නියැලෙමින් යථාවාදී තථාකාරී බුදුගුණය ප්‍රකට කළහ. මෙවැනි අවස්ථාවක් බුදුරජාණන් වහන්සේ .............................. වැඩමවීමෙන් තහවුරු වේ.
(1) කිඹුල්වත් පුරයට
(2) උරුවෙල් දනව්වට
(3) අලව් පුරයට
(4) ගෝසිංග වනයට
(5) පාරිලෙය්‍ය වනයට

35. ථේරවාද බෞද්ධ ධර්ම සංගායනා පැවැත්වීම පිළිබඳ පූර්වාදර්ශයක් බුදුරදුන් ජීවමාන සමයේදී ම සපයා දී ඇති බවට සාක්ෂි දක්නට ලැබේ. ඒ අනුව එම සාධක ඇතුළත් මූලාශ්‍රය වන්නේ,
(1) චුල්ලවග්ගපාලියයි.
(2) මහාපරිනිබ්බාණ සූත්‍රයයි.
(3) පාසාදික සූත්‍රයයි.
(4) සමන්තපාසාදිකාවයි.
(5) මහාවංසයයි.

36. ථේරවාද බෞද්ධ ධර්ම සංගායනාවන්හිදී ගනු ලැබූ තීරණ කිහිපයක් පහත දැක් වේ.
A - ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීම
B - පනවන ලද ශික්ෂා වෙනස් නො කර පවත්වාගෙන යාමට තීරණය කිරීම
C - උබ්බාහිකාවක් මගින් උද්ගතව තිබූ ගැටලු විසඳීම
D - නැවතී තිබූ විනය කර්ම යළි ආරම්භ කිරීම
E - ධර්මය රන් පත්වල ලියා තැබීම

ඉහත ප්‍රකාශ අතුරින් පළමු ධර්ම සංගායනාවට අදාළ ප්‍රතිඵල පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A සහ B
(2) A සහ C
(3) B සහ D
(4) C සහ E
(5) D සහ E

37. දෙවන ධර්ම සංගායනාවට ප්‍රධාන සාධකයක් වූ වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දස වස්තුවෙන් කිහිපයක් මෙසේ ය.
A - සිංගිලෝණ කප්ප
B - ද්වංගුල කප්ප
C - ගාමන්තර කප්ප
D - අමථිත කප්ප
E - ජලෝගි කප්ප

මෙකී කරුණු අතුරින් ආහාරපාන සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇත්තේ,
(1) A පමණි.
(2) A සහ B පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි.
(5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

38. අශෝක රජු යුද්ධ මාර්ගයෙන් රටවල් දිනා ගැනීමේ ප්‍රතිපත්තිය අත්හැර, ධර්ම මාර්ගයට අවතීර්ණ වූ බව ඔහු විසින් පිහිටුවන ලද ශිලා ලේඛනවලින් තහවුරු වේ. ඒ අනුව අශෝකගේ ධර්මවිජය ප්‍රතිපත්තිය පිළිබඳව සඳහන් නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.
(1) මිනිස් ඝාතන නිසා තමන් දැඩි කම්පනයට පත් වූ බව 13 වන ගිරි ලිපියේ සඳහන් වේ.
(2) ධර්ම මහාමාත්‍රවරුන් පිටත්කර හරින ලද ප්‍රදේශ පිළිබඳව කාල්සි ගිරි ලිපියේ සඳහන් වේ.
(3) දිග් විජයෙන් කළකිරුණු තමන් ධර්ම විජයෙන් ලොව ජයගන්නා බව කාල්සි ගිරි ලිපියේ සඳහන් වේ.
(4) අනෙකුත් ආගම්වලට පහසුකම් සපයමින් ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව සාංචි හා සාරානාත් යන ලිපිවල සඳහන් වේ.
(5) භේද භින්න වී සිටි භික්ෂූන් සමගි කරවා ශාසන ශෝධනයක් සිදු කළ බව බරාබර් ලිපිවල සඳහන් වේ.

39. රණකාමී අශෝක රජතුමා තමන් සිදුකළ මහා මිනිස් ඝාතන පිළිබඳ කළකිරී සිටියදී නිග්‍රෝධ සාමණේරයන් දැක පැහැදී බුදු දහම වැළඳගෙන, ධර්මාශෝකබවට පත්ව බුදුසසුනේ ව්‍යාප්තියට සිදු කළ ප්‍රධාන ම කාර්යය වූයේ,

(1) ශ්‍රමණ ප්‍රතිරූපකයන් සසුනින් බැහැර කිරීමයි.

(2) සිල්වත් සංඝයා ඒකරාශී කිරීමයි.

(3) වැම්ලිපි, ගිරිලිපි සහ පුවරු ලිපි ආදියෙන් අශෝක ධර්මය ව්‍යාප්ත කිරීමයි.

(4) රටවල් නවයකට බුදුදහම ව්‍යාප්ත කිරීමයි.

(5) මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන් ලවා කථාවත්ථුප්පකරණය රචනා කරවීමයි.

40. බුදුසසුනේ චිරස්ථිතිය හා ව්‍යාප්තිය සඳහා කටයුතු කළ භාරත දේශයේ රජවරුන් අතුරින් කණිෂ්ක රජු විසින් සිදු කරන ලද ශාසනික සේවාවක් වන්නේ,

(1) බුදුරදුන් විවිධ ස්ථානවලදී දෙසූ ධර්මය සහ විනය ඒකරාශී කරවා පිටක වශයෙන් සංස්කරණය කිරීමට දායකත්වය සැපයීමයි.

(2) අවිනයවාදී භික්ෂූන්ගේ අකැප පිළිගැනීම් විනිශ්චය කරවා ප්‍රතික්ෂේප කොට භික්ෂු විනය යළි ප්‍රතිෂ්ඨාපනය කරවීමට සහාය දැක්වීමයි.

(3) නිකාය රාශියකට බෙදී සිටි භික්ෂු සංඝයා සමගි කරවා ථෙරීය සම්ප්‍රදාය තුළට ඒකරාශී කරවීමයි.

(4) මගධ රාජ්‍ය මුල්කොට විදේශ ධර්මදූත සේවා පිටත් කර යැවීමයි.

(5) බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවෙන් සංගායනා කරවා විභාෂා අටුවා රචනා කිරීමට දායක වීමයි.

41. පහත සඳහන් වන්නේ භාරතයේ පැවති සුප්‍රසිද්ධ බෞද්ධ විශ්වවිද්‍යාල සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A - දීපංකර ශ්‍රී ඥාන මහා පඬි හිමියෝ මෙහි විශ්වවිද්‍යාලයාධිපති තනතුර හෙබවූහ.

B - මෙම විශ්වවිද්‍යාලය ගොඩනැගීමට මූලිකව ක්‍රියා කළේ ධර්මපාල රජු ය.

C - විද්‍යාගෘහ නමින් හැඳින් වූ සදිසාවන්ගෙන් ඇතුළුවීමේ දොරටු සහිත සුවිසල් දේශන ශාලාවක් මධ්‍ය කොට ගොඩනැගිලි තිබුණා ඇත.

D - මෙම විශ්වවිද්‍යාලය තුළ සම්මිතීය නිකායික ඉගැන්වීම්වලට ප්‍රධාන තැනක් හිමි විය.

E - මෙම විශ්වවිද්‍යාලය හීනයාන අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය විය.

මෙයින් වික්‍රමශිලා විශ්වවිද්‍යාලය හා සම්බන්ධව නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A පමණි.

(2) A සහ B පමණි.

(3) A, B සහ C පමණි.

(4) A, B, C සහ D පමණි.

(5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

42. ප්‍රාග් බෞද්ධ ලක්දිව සමාජයවකාවට පත් දෙවිවරුන් අතුරින් නුග ගසට සහ තල් ගසට අරක්ගෙන සිටිතැයි විශ්වාස කළේ,

(1) පුරදේව සහ කම්මාර දේව ය.

(2) විරූඪ සහ විරූපාක්ෂ ය.

(3) පුලින්ඩර සහ පච්ඡිමරාජිනී ය.

(4) වෛශ්‍රවණ සහ ව්‍යාධ දේව ය.

(5) කම්මාර දේව සහ සුමන ය.

43. ලක්දිව රජු බෞද්ධයකු පමණක් නොව බෝධිසත්ත්වයකු ද විය යුතු යැයි ප්‍රකාශ කරන ලද්දේ,

(1) දුටුගැමුණු රජතුමා විසින් ය.

(2) සද්ධාතිස්ස රජතුමා විසින් ය.

(3) දෙවන පැතිස් රජතුමා විසින් ය.

(4) IV වන මිහිඳු රජතුමා විසින් ය.

(5) මහසෙන් රජතුමා විසින් ය.

44. පහත සඳහන් විහාරාරාම අතුරින් අනුරාධපුර මහා විහාරයට අයත් අනුබද්ධ ආයතනයක් වූයේ කුමක් ද?

(1) විරංකුරාරාමය (2) දක්ඛිණ ගිරිය (3) අශෝකාරාමය

(4) උත්තරාරාමය (5) ගුත්තවංක පිරිවෙණ

45. උපතේ සිට මරණය දක්වා සෑම වැදගත් අවස්ථාවක ම නිසි චාරිත්‍ර විධි ඉටු කිරීම ශ්‍රී ලාංකේය සිංහල බෞද්ධ ජන සමාජයේ ප්‍රමුඛ ලක්ෂණයකි. ඒ අනුව පුද්ගල ජීවිතයක මුල් කාල පරිච්ඡේදයේ සිදු කරනු ලබන චාරිත්‍ර කිහිපයක් පහත දැක් වේ.

A - ඉඳුල් කට ගෑම
B - නම් තැබීම
C - ශාස්ත්‍ර ශාලාවකට බාර දීම
D - දොරට වැඩීම
E - අකුරු කියවීම

ඉහත කරුණු අතුරින් චාරිත්‍ර ඉටු කිරීමේ අනුපිළිවෙළ ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, D, E, C
(2) B, C, D, E, A
(3) B, D, A, E, C
(4) B, D, C, A, E
(5) D, A, B, E, C

46. ක්‍රි.ව. 6 වන සියවසේදී චීනයට පැමිණි බෝධිධර්ම හිමියන් එරට ව්‍යාප්ත කරන ලද බෞද්ධ සම්ප්‍රදායක් ලෙස සැලකෙන්නේ,

(1) තියෙන් තයි සම්ප්‍රදායයි.
(2) සන්රොන් සම්ප්‍රදායයි.
(3) තිච්රෙන් සම්ප්‍රදායයි.
(4) ජොජිත්සු සම්ප්‍රදායයි.
(5) හොස්සෝ සම්ප්‍රදායයි.

47. බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර බුදුරජාණන් වහන්සේ වෙනුවට යොදා ගත් සංකේතයක් නො වන්නේ,

(1) බෝධියයි.
(2) ස්තූපයයි.
(3) සිරිපතුලයි.
(4) ආසනයයි.
(5) ධර්මචක්‍රයයි.

48. භාරතයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණ සම්ප්‍රදායන් කිහිපයක් දැකිය හැකි අතර ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන් එහිලා ප්‍රමුඛ වේ. පහත දැක්වෙන්නේ එම සම්ප්‍රදායන් දෙකට අයත් ලක්ෂණ කිහිපයකි.

A - ශාක්‍යසිංහ ලීලාව දක්වයි.
B - හිසකෙස් ශෛලිගත ය.
C - මහා කාරුණික ලීලාව දක්වයි.
D - අත් සංවරව සිරුරට ලංව ඇත.
E - නෙත් අඩවන් ය. තොල් සිහින් ය.

ඉහත ලක්ෂණ අතුරින් මථුරා සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමා ලක්ෂණ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B
(2) A සහ C
(3) B සහ C
(4) C සහ D
(5) D සහ E

49. දඹදෙණි යුගයේදී ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කෘති රැසක් බිහි වී තිබේ. ඒ අතර තත්කාලීනව වඩාත් සම්භාවනාවට පත්ව තිබූ පද්‍ය සාහිත්‍ය කෘතිය වන්නේ,

(1) සද්ධර්මරත්නාවලියයි.
(2) කව්සිළුමිණයි.
(3) පූජාවලියයි.
(4) ථූපවංසයයි.
(5) බුත්සරණයි.

50. ශ්‍රී ලංකාවේ නාඩගම් සම්ප්‍රදාය දේශීය සංස්කෘතියෙහි ආභාසයෙන් සංවර්ධනයට පත්ව තිබේ. එහිලා ලක්දිව ප්‍රචලිතව පැවති නාඩගම් කිහිපයක් පහත දැක් වේ.

A - සඳකිඳුරු නාඩගම
B - විදුර නාඩගම
C - හේමමාලි නාඩගම
D - මනමේ නාඩගම
E - වෙස්සන්තර නාඩගම

ඉහත නාඩගම් අතුරින් ජාතක කතා තේමා කොටගෙන නිර්මාණය කළ නාඩගම/නාඩගම් ඇතුළත් වරණය තෝරන්න.

(1) A පමණි.
(2) A සහ B පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, B, D සහ E පමණි.
(5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

* * *

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023(2024)

**විෂය අංකය / பாட இலக்கம்:** 45

**විෂයය / பாடம்:** බෞද්ධ ශිෂ්ටාචාරය

### ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 3 | 31. | 5 | 41. | 3 |
| 02. | 3 | 12. | 2 | 22. | 5 | 32. | 1 | 42. | 4 |
| 03. | 3 | 13. | 2 | 23. | 2 | 33. | 2 | 43. | 4 |
| 04. | 5 | 14. | 5 | 24. | 5 | 34. | 2 | 44. | 5 |
| 05. | 2 | 15. | 4 | 25. | 1 | 35. | 3 | 45. | 3 |
| 06. | 3 | 16. | 5 | 26. | 3 | 36. | 1 | 46. | 1 |
| 07. | 3 | 17. | 4 | 27. | 4 | 37. | 5 | 47. | 1/2/3/4/5 |
| 08. | 5 | 18. | 2 | 28. | 4 | 38. | 3 | 48. | 1 |
| 09. | 4 | 19. | 5 | 29. | 1 | 39. | 4 | 49. | 2 |
| 10. | 1 | 20. | 1 | 30. | 5 | 40. | 5 | 50. | 4 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන චතුර් වර්ණය නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යන් තුනක් ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුසමයෙන් කාන්තාවට ආගමික නිදහස ලැබුණු බව සාධක හතරක් මගින් තහවුරු කරන්න. (ලකුණු 04යි.)
   (iv) නිගණ්ඨනාතපුත්ත තුමන් ඉදිරිපත් කළ කර්ම සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05යි.)
   (v) පකුධ කච්චායනගේ ඉගැන්වීම් මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

2. (i) බුද්ධකාලීන භාරතීය සමාජයේ කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් පැවති බවට සාධක හතරක් දක්වන්න. (ලකුණු 02යි.)
   (ii) බුද්ධකාලීන භාරතයේ පැවති සමූහාණ්ඩු පාලන ක්‍රමයේ අනන්‍යතා ලක්ෂණ තුනක් ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනයෙහිලා විවිධ ක්‍රම භාවිත කළ බව සාධක හතරක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)
   (iv) බුදුරජාණන් වහන්සේ සතුව පැවති පුරිසදම්මසාරථී බුදුගුණය අවස්ථා තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි.)
   (v) ධර්ම සේනාපති සැරියුත් මහරහතන් වහන්සේගේ චරිත ලක්ෂණ හතරක් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06යි.)

3. (i) "අක්කෝධේන ජිනේ කෝධං" යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) සිගාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය-සේවක යුතුකම් හා වගකීම් දහය නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) සමාජ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය අග්ගඤ්ඤ සූත්‍රානුසාරයෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 05යි.)
   (v) බුද්ධකාලීන ධර්මදූත සේවාවෙහි සාර්ථකත්වයට භික්ෂුවගෙන් ඉටු වූ දායකත්වය නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06යි.)

## II කොටස

4. (i) ජනහිතකාමී පාලන තන්ත්‍රයක් ගොඩනැංවීම උදෙසා දස සක්විතිවත්වල අදාළත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 10යි.)
   (ii) "උපයන ධනය නම් අභිවෘද්ධියට පමණක් යොදා ගැනීම බුදුසමය අනුමත නොකරයි." බෞද්ධ පරිභෝජන චින්තනය ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 10යි.)

5. (i) නූතන සමාජයෙහි පවත්නා අධාර්මික වාණිජ ක්‍රමෝපායයන් පාලනය සඳහා අදාළ කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් විස්තර කරන්න. (ලකුණු 10යි.)
   (ii) නූතන පවුල් සංස්ථාවේ ගැටලු නිරාකරණය කරගැනීමට මංගල සූත්‍රාගත ඉගැන්වීම්වලින් ලැබෙන පිටිවහල පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

6. (i) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු යුක්ති ගෙනහැර දක්වා, එහි ප්‍රතිඵලයක් ලෙස ධර්ම විනය සංරක්ෂණය කළ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)
   (ii) බුදුසසුනේ සංවර්ධනය උදෙසා පැරණි ලක්දිව පාලකයන්ගෙන් ඉටු වූ මෙහෙය අනුරාධපුර යුගයේ රජවරුන් දෙදෙනකුගේ ශාසනික සේවා ඇසුරින් අගයන්න. (ලකුණු 10යි.)

7. (i) සාම්ප්‍රදායික ථායි සංස්කෘතියේ පෝෂණයට බුදුසමයෙන් ලැබුණු ආලෝකය නිදසුන් මගින් ප්‍රකට කරන්න. (ලකුණු 10යි.)
   (ii) පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා සිදු කෙරෙන චාරිත්‍ර විධි විෂයයෙහි බෞද්ධාභාසය ලැබී ඇති අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

8. (i) ශ්‍රී ලාංකේය ස්තූප කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ විචාරාත්මක විවරණයක් කරන්න. (ලකුණු 10යි.)
   (ii) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විස්තර සපයන්න.
      (1) ඉදු වර්ණය
      (2) සතර අගති
      (3) අභයගිරිය
      (4) සඳකඩපහණ

(ලකුණු 05 × 2 =10 යි.)

***

# අ.පො.ස. (උ.පෙළ) විභාගය – 2023 (2024)

## 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

## II පත්‍රය

### I කොටස

**1. (I) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දක්වෙන චතුර් වර්ණය නම් කරන්න.**

බ්‍රාහ්මණෝස්‍ය මුඛමාසීත්
බාහු රාජන්‍යඃ කෘතඃ
ඌරු තදස්‍ය යද් වෛශ්‍යඃ
පද්භ්‍යාම් ශුද්‍රෝ අජායත
(ඍග් වේදයේ 10 වෙනි මණ්ඩලයේ 90 වෙනි පුරුෂ සුක්තය)

චතුර් වර්ණය නම්,

බ්‍රාහ්මණ
ක්‍ෂත්‍රිය
වෛශ්‍ය
ශුද්‍ර

(ලකුණු 02යි.)

**1. (II) ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් තුනක් ගෙනහැර දක්වන්න.**

- විවාහ වී කාමභෝගී ජීවිතයක් ගත කිරීම - සුදුසු වයසේදී සුදුසු කුලයකින් විවාහයක් සිදු කරගෙන කාමභෝගී ජීවිතයක් ගත කිරීම
- අඹු දරුවන් පෝෂණය කිරීම - පිරිමි දරුවකු ප්‍රාර්ථනා කිරීම තම බිරිඳට හා දරුවන්ට යුතුකම් ඉටු කරමින් අවශ්‍යතා සපුරාලමින් පෝෂණය කිරීම
- ආර්ථික සම්පත් දියුණු කර ගැනීම - ස්වධර්මවල අනුමත කර ඇති පරිදි ස්වකීය වර්ණයට අයත් කාර්යයන්හි නියැලෙමින් ආර්ථික සම්පත් ළඟා කර ගැනීම
- යාග හෝම පවත්වමින් ආගමික චාරිත්‍ර ඉටු කිරීම - ලෞකික අරමුණු සාධනය කර ගැනීම හා බ්‍රහ්ම සහව්‍යතාව (මෝක්ෂය) අපේක්ෂා කරමින් ආගමික සංස්කාර විධි සිදු කිරීම

(ලකුණු 03යි.)

**1. (III) බුදුසමයෙන් කාන්තාවට ආගමික නිදහස ලැබුණු බව සාධක හතරක් මගින් තහවුරු කරන්න.**

- පුරුෂ පක්ෂයට මෙන්ම කාන්තාවට ද, සමාන ලෙස ආගමික වරප්‍රසාද ලබා දීම
- භික්ෂුණී ශාසනය පිහිටුවමින් කාන්තාවට පැවිදිවීමේ අවස්ථාව ලබා දීම

උදා: මහා ප්‍රජාපතී ගෝතමිය, ඛේමා, උප්පලවණ්ණා, පටාචාරා වැනි භික්ෂුණීන්

- ඛේමා, උප්පලවණ්ණා ආදී භික්ෂුණීන්ට අග්‍ර ශ්‍රාවිකා තනතුරු පිරිනැමීම
- භික්ෂුණීන්ගේ දක්ෂතා අගයමින් ශාසනික තනතුරු ප්‍රදානය කිරීම

උදා: මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය - චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග්‍ර
ඛේමා තෙරණිය ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර අග්‍ර
උප්පලවණ්ණා තෙරණිය ඍද්ධිමත් භික්ෂුණීන් අතර අග්‍ර
පටාචාරා තෙරණිය විනයධර භික්ෂුණීන් අතර අග්‍ර

- භික්ෂු-භික්ෂුණී උභය පක්‍ෂයට ම සමාන අයිතිවාසිකම් හිමි ව තිබීම

- ගෘහස්ථ ජීවිතය තුළ කාන්තාවට ආගමික නිදහස ලබාදෙමින් උපාසිකාවක් ලෙස ඇගයීමට ලක්කිරීම
- ඔවුන් අතරින් ඇතැම් උපාසිකාවන්ට තනතුරු ප්‍රදානය කරමින් ඇගයීම

උදා: විශාඛා - අග්‍ර දායිකාව
බුජ්ජුත්තරා - බහුශ්‍රැත උපාසිකාවන් අතර අග්‍ර
නකුලමාතා - විශ්වාස කතා ඇත්තියවුන් අතර අග්‍ර

(ලකුණු 04යි.)

## 1. (IV) නිගණ්ඨනාතපුත්ත තුමන් ඉදිරිපත් කළ කර්ම සංකල්පය කෙටියෙන් හඳුන්වන්න.

- බුද්ධකාලීන භාරතයේ සිටි ෂට් ශාස්තෘවරුන් අතුරින් කර්මය පිළිගත් එකම ශාස්තෘවරයා නිගන්ථනාතපුත්ත තුමා ය.

**ත්‍රිදණ්ඩ සංකල්පය**

- කායදණ්ඩ
- වචීදණ්ඩ
- මනෝදණ්ඩ

මෙම ත්‍රිදණ්ඩය අතුරින් වඩාත් ප්‍රබල ලෙස කායදණ්ඩය සැලකෙන බව

- "ඉමෙසං ඛො ආවුසො ගොතම තිණ්ණං දණ්ඩානං ඒවං පටිවිභත්තානං ඒවං පටිවිසිට්ඨානං කායදණ්ඩං නිගණ්ඨො නාතපුත්තො මහාසාවජ්ජතරං පඤ්ඤාපෙති...."

(මජ්ඣිම නිකාය උපාලි සූත්‍රය)

- පුබ්බේකතහේතුවාදය - සියල්ල පෙර කරන ලද කර්මය අනුව සිදුවන බව ඉගැන්වීම

**කර්ම විභාගය**

- පෙර කරන ලද කර්ම ගෙවා දැමීම හා නව කර්ම රැස් නො කිරීමෙන් දුකින් නිදහස් විය හැකි බව
- පෙර කරන ලද කර්ම ගෙවා දැමීමට අත්තකිලමථානුයෝගය හෙවත් ශරීරයට දැඩි ලෙස දුක්දීම සඳහා පංචතාපතප්පනය ක්‍රියාත්මක කිරීම

**අෂ්ටවිධ කර්ම විභාගය**

- කර්ම සංකල්පය මූලික කොටස් අටකින් යුක්ත බව
  - ඥාණාවරණීය කර්ම
  - දර්ශනාවරණීය කර්ම
  - වේදනීය කර්ම
  - මෝහනීය කර්ම
  - ආයුෂීය කර්ම
  - නාම කර්ම
  - ගෝත්‍ර කර්ම
  - අන්තරාය කර්ම
- නිගණ්ඨනාතපුත්ත තුමාගේ කර්ම සංකල්පය භෞතිකවාදී ස්වරූපයක් ගෙන ඇති බව

**පරම අවිහිංසාවාදය**

- දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙන පරිදි නිගණ්ඨනාතපුත්ත ශාස්තෘතුමාගේ කර්මවාදී ඉගැන්වීම පරම අවිහිංසාවාදයක් බව
- පරම අවිහිංසාවාදය චතුයාම සංවරය තුළින් විග්‍රහකර ඇති බව

චතුයාම සංවර ශීලය

[illegible] [illegible]

[illegible] - [illegible]

[illegible] - [illegible]

[illegible] - [illegible]

- [illegible]

[illegible]

[illegible] (ලකුණු 06යි.)

1. (V) පකුධ කච්චායනගේ ඉගැන්වීම මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම් පැහැදිලි කරන්න.

- පකුධ කච්චායනගේ ඉගැන්වීම දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වන බව
- විශ්වය හා ප්‍රාණි දේහයන්, මූලිකයෙන්, නිර්මාණයෙන් හෝ වෙනත් කිසිවෙකු විසින් මවන ලද හෝ නොමැවූ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යන සප්ත පදාර්ථයන්ගෙන් නිර්මාණය වූවක් ය. එම සප්තකායන් එකක් පරිණාමනය නොවේ ස්ථිර පැවැත්මක් සහිත ය.

"....... සත්තිමෙ මහාරාජ කායා අකටා, අකටවිධා අනිම්මිතා අනිම්මාතා..... කතමේ සත්ත පඨවි කායෝ, ආපෝ කායෝ, තේජෝ කායෝ, වායෝ කායෝ, සුඛෙ, දුක්ඛෙ, ජීවේ සත්තමෙ........ තත්ථ නත්ථි හන්තා වා ඝාතේතා වා ....යෝපි තිණ්හේන සත්ථේන සීසං ඡින්දති න කෝචි කඤ්චි ජීවිතා වෝරෝපේති. සත්තන්නං යේව කායානං මන්තරේන සත්ථං විවරමනුපතතීති"
(දීඝ නිකාය සාමඤ්ඤඵල සූත්‍රය)

- අකිරියවාදී, ශාස්වතවාදී ඉගැන්වීමක් වන මෙය ද්‍රව්‍ය පදාර්ථ මූලික වන බැවින් භෞතිකවාදී ඉගැන්වීමක් ද වන බව

**සමාජ සදාචාරයට වන බලපෑම**

- සප්ත පදාර්ථවාදය බුදුසමයෙන් ප්‍රතික්ෂේප වන බව
- තියුණු සැතකින් යමෙක් යමෙකුගේ හිස සිඳින්නේ නම් එයින් කිසිවෙකු විසින් තවත් අයෙකු ඝාතනය නොකරන්නේ යැයි මෙතුමා කරන ඉගැන්වීම මගින් ක්‍රියාවෙහි වගකීම පුද්ගලයා වෙතින් මුළුමනින්ම බැහැර වන බව
- කුසලාකුසල කර්මවලට අදාළ විපාක නැති බව පෙන්වීම නිසා මිනිසා පැහැසි ක්‍රියාවලට යොමුවූ බව
- සමාජය තුළ සදාචාරය අර්ථවත් කළ නොහැකි බව
- සමාජය තුළ විවිධ ගැටුම් නිර්මාණය වීම හා පුද්ගලයා දුරාචාරයට යොමුවන බව

[illegible]

(ලකුණු 06යි.)

පකුධ කච්චායනගේ ඉගැන්වීම් විස්තර කර (3)

සමාජ සදාචාරයට බලපෑම කරන අහිතකර බලපෑම (3)

**2. (I) බුද්ධකාලීන භාරතීය සමාජයේ කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් පැවති බවට සාධක හතරක් දක්වන්න.**

- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වා ඇති වෘත්තීන් අතර කෘෂිකර්මාන්තය දැහැමි ජීවන වෘත්තියක් ලෙස හඳුන්වා ඇති බව
- දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ දක්වෙන පරිදි කෘෂිකර්මාන්තයට අනුග්‍රහ දැක්වීම රජුගේ ප්‍රමුඛ කාර්යයක් බව (යම්කෙනෙක් කෘෂිකර්මාන්තයෙහි උත්සාහ වන්නේ නම් රජතෙමේ ඔවුන්ට ධාන්‍ය බීජුවට ද බත් ද දිය යුතු බව)
- කෘෂිකර්මාන්තය ක්ෂත්‍රිය වර්ණයේ කාර්යයක් බව
  "ඛෙත්තානං අධිපති ති ඛෝ වාසෙට්ඨා ඛත්තියෝ" (දීඝ නිකාය අග්ගඤ්ඤ සූත්‍රය)
- බුද්ධකාලයේ විසූ රජවරුන්ගේ නම් අගට ඕදන යන්න එකතු කොට තිබූ බව
  උදා: සුද්ධෝදන, අමිතෝදන, ධෝතෝදන, මිතෝදන සුක්කෝදන
- වප් මඟුල් උත්සවය රජුගේ ප්‍රධානත්වයෙන් සිදුකර ඇති බව
- පංච මහා ගංගාවන්ගෙන් සමන්විත දියුණු වාරිමාර්ග පද්ධතියක් තිබූ බව
- ශාක්‍ය කෝලිය වංශිකයන් රෝහිණී නදියේ ජලය කෘෂිකර්මාන්තය සඳහා බෙදාගැනීමට ගැටුම් ඇතිකරගත් බව
- ~~කෘෂිකර්මාන්තය සඳහා ජලය බෙදාගැනීමේ ගැටලු ඇති වූ බව~~ (අත් අකුරින්: ඇදැල කරුණු උපමා කොට ගෙන ධර්මය දේශනා කිරීම -)
  උදා:ධර්ම දේශනා කිරීමේදී කෘෂි උපකරණ හා තදනුබද්ධ අංග උපමා වශයෙන් යොදාගත් බව
  (සද්ධා බීජං තපෝ වුට්ඨී - පඤ්ඤා මෙ යුග නංගලං .... කසීභාරද්වාජ සූත්‍රය)
- මගධ කෙතේ ආකෘතියට අනුව චීවරය සකස් කිරීමට උපදෙස්දී ඇති බව
- බමුණන් පවා කෘෂිකර්මාන්තයේ යෙදී ඇති බව (කසීභාරද්වාජ සූත්‍රය)

4ක් නම් කිරීමට (1)
2/3ක් කෙටියෙන් විස්තර කිරීමට (1)
4ක් කෙටියෙන් විස්තර කිරීමට (2)

(ලකුණු 02යි.)

**2. (II) බුද්ධකාලීන භාරතයේ පැවති සමූහාණ්ඩු පාලන ක්‍රමයේ අනන්‍යතා ලක්ෂණ තුනක් ගෙනහැර දක්වන්න.**

- සමූහාණ්ඩු පාලන ක්‍රමය හැඳින්වීම සඳහා ගණතන්ත්‍ර පාලන ක්‍රමය යන යෙදුම ද භාවිත කර ඇති බව
- බුද්ධකාලීන භාරතයේ වජ්ජි හා මල්ල වශයෙන් ප්‍රමුඛ ගණතන්ත්‍ර රාජ්‍ය දෙකක් පැවති බව

**සමූහාණ්ඩු පාලන ක්‍රමයේ ලක්ෂණ**

අනන්‍යතා ලක් අනු 3ක් නම් කිරීම (1) විස්තර කිරීම 1 — (1) 2 — (2) 3 — (3)

- ව්‍යවස්ථාදායක, විධායක. අධිකරණ යන ත්‍රිවිධ බලතල පාලන මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ බව
- පාලන මණ්ඩලයක් එක්ව සාමූහිකව සාකච්ඡා කොට තීරණ ගෙන ක්‍රියාත්මක කළ බව
- රාජ්‍ය පාලන මූලධර්මයක් ලෙස සප්ත අපරිහාණිය ධර්ම ක්‍රියාත්මක කළ බව
- නීතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රවේණිගත ක්‍රියාවලියට අනුගතව සිදු වූ බව
- වඩාත් ප්‍රජාතන්ත්‍රික මුහුණුවරකින් යුක්ත වූ බව
- පාලකයන් 7707 දෙනෙකුගෙන් සමන්විත වජ්ජි රාජ්‍ය බුදුරජාණන් වහන්සේගේ ඇගයීමට ලක්ව ඇති බව

(ලකුණු 03යි.)

**2. (III) බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනයෙහිලා විවිධ ක්‍රම භාවිත කළ බව සාධක හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.**

- පුද්ගල චරිත හඳුනාගෙන ධර්මය දේශනා කළ බව
- ධර්ම දේශනා කිරීමේදී ක්‍රම කිහිපයක් අනුගමනය කර ඇති බව

| | |
|---|---|
| අත්තජ්ඣාසය | - තමන් වහන්සේගේ අදහසට අනුව දහම් දෙසීම (ධම්මචක්කපවත්තන සූත්‍රය) |
| පරජ්ඣාසය | - ශ්‍රාවකයාගේ අපේක්ෂාවට අනුව දහම් දෙසීම (අරියපරියේසන සූත්‍රය) |
| අට්ඨුප්පත්තික | - හේතු වූ කරුණක අර්ථය පැහැදිලි කිරීම සඳහා දහම් දෙසීම (සිගාලෝවාද සූත්‍රය) |
| පුච්ඡාවසික | - ප්‍රශ්නයකට පිළිතුරු දීම වශයෙන් දහම් දෙසීම (මහාමංගල සූත්‍රය) |

කාරණ 4ක් නම් කිරීම (1)

1 – 1
2 – 2
3 – 3
4 – 4

- ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමේදී ක්‍රම හතරක් භාවිත කර ඇත.

| | |
|---|---|
| 1. ඒකංසව්‍යාකරණීය | - ඍජු පිළිතුරු සැපයීම (ආලවක සූත්‍රය) |
| 2. විභජ්ජව්‍යාකරණීය | - විශ්ලේෂණාත්මකව පිළිතුරු දීම (චූල්ලකම්මවිභංග සූත්‍රය) |
| 3. පටිපුච්ඡාව්‍යාකරණීය | - ප්‍රතිප්‍රශ්න අසමින් පිළිතුරු සැපයීම (චූල්ල සච්චක සූත්‍රය) |
| 4. ඨපනීය | - ආත්ම විමුක්තියට අදාළ නො වන ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් වැළකීම (චූල්ලමාලුංක්‍යපුත්ත සූත්‍රය) |

- දානකථා, සීලකථා ආදියෙන් පටන්ගෙන අනුක්‍රමයෙන් නිවනට හේතු වූ ගැඹුරු ධර්මය දේශනා කරමින් ආනුපුබ්බීකථා ක්‍රමය හා ශ්‍රාවක සිත් ධර්මාවබෝධයට නැඹුරු කරවීමේ සාමුක්කංසික ක්‍රමය අනුගමනය කිරීම

| | |
|---|---|
| • ඍජු දේශනා | - දම්සක් පැවැතුම් සූත්‍රය |
| • සාකච්ඡා ක්‍රමය | - කන්දරක සූත්‍රය |
| • උපමානුසාරී දේශනා ක්‍රමය | - අම්බලට්ඨික රාහුලෝවාද, කසීභාරද්වාජ වැනි සූත්‍ර |
| • පැවරුම් ක්‍රමය | - චූල්ලපන්ථක තෙරුන් හා කිසාගෝතමී වැනි චරිත කතා |
| • දෘෂ්‍යාධාරක භාවිතය | - නන්ද තෙරුන් හා බේමා ආදී චරිත කතා |

(ලකුණු 04යි.)

**2. (IV) බුදුරජාණන් වහන්සේ සතුව පැවති පුරිසදම්මසාරථී බුදුගුණය අවස්ථා තුනක් ඇසුරින් විස්තර කරන්න.**

අවස්ථා 3ක් නම් කිරීම (1)

- දමනය නො වූ නො හික්මුණු විවිධ පිරිස් දමනය කිරීම පුරිසදම්මසාරථී ගුණය වන බව
- ඒ ඒ චරිතවලට අනුරූප වන ක්‍රමෝපායන් භාවිත කරමින් නො දමුණු පුද්ගලයන් දමනය කිරීමට බුදුරදුන් තුළ පැවති හැකියාව මෙම ගුණයෙන් අදහස් වන බව
- එබඳු පුද්ගලයන් දමනය කිරීම සඳහා කරුණාව, මෛත්‍රිය, ඉවසීම, ප්‍රඥාව වැනි වූ ආධ්‍යාත්මික ගුණාංග භාවිත කළ බව
- තුන් බෑ ජටිලයන්, සච්චක, සෝණදණ්ඩ, අක්කෝසක, අංගුලිමාල, ආලවක, සූචිරෝම, ඛරරෝම, නාලාගිරි, අග්ගිසිඛ, නන්දෝපනන්ද, මහාකාල වැනි අය දමනයත් කළ බව

1 අවස්ථාවක් ඇසුරෙන් ලකුණු ඇත්නම් (03)

(ලකුණු 05යි.)

අවස්ථා 2 – (4)
අවස්ථා 3 – (5)

**2. (V) ධර්ම සේනාපති සැරියුත් මහරහතන් වහන්සේගේ චරිත ලක්ෂණ හතරක් ඇගයීමට ලක් කරන්න.**

- නිවැරදි දේ හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීම - ගිරග්ග සමජ්ජ වැනි උත්සවයන්හි පැවති නිරර්ථක ස්වභාවය වටහා ගැනීම
- සැබෑ කල්‍යාණ මිත්‍රයෙකු ලෙස කටයුතු කිරීම - කුඩාකල පටන් සසුන් ගත වන තුරුත් ඉන් අනතුරුවත් මුගලන් හිමි සමග පැවති ඇසුර (කෝලිත, උපතිස්ස)
- තම ඥාති වර්ගයාට ශාසන ප්‍රතිලාභය ලබාදීම - චුන්ද, උපසේන, රේවත නම් වූ සහෝදරයන් තිදෙනාට ද, චාලා, උපචාලා, සිසූපචාලා යන සහෝදරියන් තිදෙනාට ද මාර්ගඵල ලාභයට මග පෙන්වීම
- මාතෘ උපස්ථානය - බ්‍රාහ්මණ මතවාදයන්හි එල්බගෙන සිටි තම මෑණියන් වූ රූපසාරී බැමිණියට ජීවිතයේ අවසන් කාලයේ සෝවාන්වීමට මග පෙන්වීම
- මනා ඉවසීමෙන් යුක්තවීම
  - දිනක් පිඬුසිඟා වඩිද්දී මිසදිටු බමුණෙකු පැමිණ උන්වහන්සේගේ පිටට වැරෙන් පහරක් ගැසුව ද එයින් බිඳකුදු සිත සසල කර නො ගැනීම
  - භාවනා කරමින් වැඩසිටින අවස්ථාවක රෞද්‍ර යක්ෂයෙක් මුඩුකර ඇති හිස දැක ඉතා වැරෙන් ටොක්කක් ඇනීම
  - ජන්න තෙරුන් වැනි පෘථග්ජන පිරිස් විසින් කරනු ලැබූ චෝදනා ඉවසීම
- මනා ගුරු ගෞරවයෙන් යුක්ත වීම
  - දිනකට තුන්වරක් අස්සජි මහරහතන් වහන්සේ වැඩසිටින දිසාවට නමස්කාර කිරීම
- නොමග ගිය අය සුමඟට ගැනීම
  - දේවදත්ත හිමියන් විසින් තම අනුගාමිකයන් බවට පත්කරගෙන සිටි භික්ෂූන් වහන්සේලා නැවත බුදුරජාණන් වහන්සේ වෙත කැඳවාගෙන ඒම
- අනතිමානී බව
  - මිදුල අමදිනවිට සිවුරුපොට බිම ගැවෙන බව කුඩා සාමණේර හිමි නමක් පෙන්වා දුන්විට එය පිළිගැනීම
- ගිලානෝපස්ථානය
  - කුෂ්ට රෝගයෙන් පෙළුණ සමිතගුප්ත හිමියන්ට උපස්ථාන කිරීම

(ලකුණු 06යි.)

**3. (I) "අක්කෝධේන ජිනේ කෝධං" යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න.**

අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනේ
ජිනේ කදරියං දානේන - සච්චේන අලිකවාදිනං

(ලකුණු 02යි.)

**3. (II) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න.**

ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නො කිරීමෙන් හෙවත් මෛත්‍රියෙන් දිනිය යුතු ය. අසත්පුරුෂයා සත්පුරුෂකමෙන් දිනිය යුතු ය. මසුරා දානයෙන් දිනිය යුතු ය. බොරු කියන්නා සත්‍ය වචනයෙන් දිනිය යුතු ය.

(ලකුණු 03යි.)

3. (III) සිගාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය-සේවක යුතුකම් හා වගකීම් දහය නම් කරන්න.

ස්වාමියාගෙන් සේවකයාට

1. ශක්ති ප්‍රමාණයට අනුව වැඩ කොටස් පැවරීම (යථාබලං කම්මන්තේ සංවිධානේන)
2. සුදුසු පරිදි ආහාර හා වැටුප් ලබාදීම (භත්ත වේතනානුප්පදානේන)
3. ගිලන් වූ කල උපස්ථානාදිය සිදුකිරීම (ගිලානුපට්ඨානේන)
4. මිහිරි ආහාරපානාදිය නිසිලෙස බෙදාදීම (අච්ඡරියානං රසානං සංවිභාගේන)
5. සුදුසු අවස්ථාවන්හිදී නිවාඩු ලබාදීම (සමයේ වොස්සග්ගේන)

සේවකයාගෙන් ස්වාමියාට

1. ස්වාමියාට පළමු ව අවදිවීම (පුබ්බුට්ඨායිනෝ)
2. ස්වාමියාට පසු ව නින්දට යාම (පච්ඡානිපාතිනෝ)
3. ස්වාමියා දුන් දෙය පමණක් ගැනීම (දින්නාදායිනෝ)
4. වැඩ කටයුතු ඉතා හොඳින් කිරීම (සුකතකම්මකාරිනෝ)
5. ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම (කිත්තිවණ්ණහරා)

(ලකුණු 04යි.)

3. (IV) සමාජ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය අග්ගඤ්ඤ සූත්‍රානුසාරයෙන් ගෙනහැර දක්වන්න.

- ~~සමාජ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වන බව~~
- හේතුඵලවාදය මත සමාජ ප්‍රභවය සිදු වූ බව
- පාරිසරික වෙනස්කම් ඇතිවීම හා සත්ත්වයන් තුළ තෘෂ්ණාව, සොරකම, බොරුව, දඬුවම, ඝාතනය ආදී අසත්ධර්ම පහළ වූබව
- කෙත්වතු පාලනය සම්බන්ධයෙන් උද්ගත වූ ගැටලු පාලනය කිරීමට මහජනතාවගේ සම්මතයෙන් මනා පෞරුෂයකින් හෙබි ප්‍රියමනාප පුද්ගලයෙකු පාලකයා ලෙස තෝරාපත්කරගත් බව
  "මහාජන සම්මතෝති බෝ වාසෙට්ඨා මහාසම්මතෝ, මහාසම්මතෝත්වේව පඨමං අක්ඛරං උපනිබ්බත්තං"
- කෙත්වතුවලට අධිපති වූ බැවින් ක්ෂත්‍රිය නම් විය.
  "ඛෙත්තානං අධිපතීති බෝ වාසෙට්ඨා ඛත්තියෝ ඛත්තියෝත්වේව දුතියං අක්ඛරං උපනිබ්බත්තං"
- ධර්මයෙන් ජනතාව රංජනය කරන බැවින් රජු නම් විය.
  "ධම්මේන පරේ රඤ්ජේතීති බෝ වාසෙට්ඨා රාජා රාජාත්වේව තතියං අක්ඛරං උපනිබ්බත්තං"
- සදාචාර විරෝධී ක්‍රියා පිළිකුල් කොට ලාමක අකුසල ධර්මයන් බැහැර කළ පිරිස් බ්‍රාහ්මණ නම් වූ බව
  "පාපකේ අකුසලේ ධම්මේ බාහෙන්තීති බෝ වාසෙට්ඨා බ්‍රාහ්මණා බ්‍රාහ්මණාත්වේව පඨමං අක්ඛරං උපනිබ්බත්තං"
- මෛථුන්දම් සේවනය කරමින් විවිධ කර්මාන්තවල නිරතවූවෝ වෛශ්‍ය නම් වූ බව
  "මේථුනං ධම්මං සමාදාය විස්සුතං කම්මන්තේ පයෝජෙන්තීති බෝ වාසෙට්ඨා වෙස්සා වෙස්සාත්වේව අක්ඛරං උපනිබ්බත්තං"
- සදාචාර විරෝධී ක්‍රියාවල නිරතවූවන් ශුද්‍ර නම් වූ බව
  "ලුද්දාචාරා ඛුද්දාචාරාති බෝ වාසෙට්ඨා සුද්දා සුද්දාත්වේව අක්ඛරං උපනිබ්බත්තං"

ආදී ලෙස සමාජ ප්‍රභවය සිදු වූ අයුරු දක්වා තිබිය යුතු ය.

(ලකුණු 05යි.)

3. (V) බුද්ධකාලීන ධර්මදූත සේවාවෙහි සාර්ථකත්වයට භික්ෂූවගෙන් ඉටු වූ දායකත්වය නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

- ලාභ කීර්ති ප්‍රශංසා කිසිවක් අපේක්ෂා නොකර නිස්සරණාධ්‍යාසයෙන් ම කටයුතු කළ භික්ෂූන් වහන්සේලා ලෝක සත්ත්වයා දුකින් මුදවා ගැනීම සඳහා පරාර්ථචර්යාවේ නිරත වූ බව
- බුදුරජාණන් වහන්සේ ප්‍රථම රහත් හැටනම අමතා කරන ලද අවවාදය ඒ ආකාරයෙන් ම ඉටුකිරීම නිසා ධර්ම දූත සේවාව සාර්ථක වූ බව
  "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය..."
- නොයෙකුත් බාධක නොතකා ගම් නියම්ගම්, ජනපද සිසාරා වැඩම කරමින් ධර්මය ව්‍යාප්ත කළ බව
- කොණ්ඩඤ්ඤ, අස්සජි, සැරියුත්, මුගලන්, ආනන්ද, මහාකාශ්‍යප, පුණ්ණමන්තානිපුත්ත, පිණ්ඩෝලභාරද්වාජ ආදී තෙරවරුන්ගේ ධර්මදූත සේවා

උදා :

**කොණ්ඩඤ්ඤ තෙරුන්**
- දෝණවත්ථු නම් තම උපන් ගමේ ජනතාවට බුදුදහම හඳුන්වාදීම
- බෑණා කෙනෙකු වූ පුණ්ණමන්තානිපුත්ත සසුන්ගත කරවීම

**අස්සජි තෙරුන්**
- කෝලිත උපතිස්ස දෙදෙනා සසුන්ගත කරවීම

**සැරියුත් තෙරුන්**
- ගැඹුරු දහම් කරුණු සරලව ඉතා දක්ෂ ලෙස දේශනා කිරීම
- කෙටියෙන් දෙසූ ධර්මය විස්තර කොට දේශනා කිරීමේ දක්ෂතාවෙන් යුක්තවීම
- ස්වකීය ඥාතීන් දහමට යොමුකිරීම

**මුගලන් තෙරුන්**
- මච්ඡරියකෝසිය සිටු පවුල දහමෙහි පිහිටුවීම
- නන්දෝපනන්ද නාගරාජයා දමනය කොට බුදුදහමෙහි පැහැදවීම
- නන්දුත්තරාව දහමෙහි පැහැදවීම

**ආනන්ද තෙරුන්**
- භික්ෂුණී සමාජය පිහිටුවීමට පුරෝගාමී වීම
- ආනන්ද බෝධිය රෝපණය කරවීම
- රජ බිසෝවරුන්ට දහම් දෙසීම

**මහාකාශ්‍යප තෙරුන්**
- රූපකායෙන් බුදුරජාණන් වහන්සේට සමාන වූ නිසා බොහෝ දෙනා ප්‍රසාදයට පත්වීම

**පුණ්ණ තෙරුන්**
- දරුණු මිනිසුන් විසූ සුනාපරන්ත දේශයට වැඩම කොට එහි වැසියන්ට ධර්මය අවබෝධ කරවීම

**පිණ්ඩෝලභාරද්වාජ තෙරුන්**
- උදේනි රජු බුදුදහම කෙරෙහි පැහැදවීම

(ලකුණු 06යි.)

4. (I) **ජනහිතකාමී පාලන තන්ත්‍රයක් ගොඩනැංවීම උදෙසා දස සක්විතිවත්වල අදාළත්වය සාකච්ඡා කරන්න.**

- දැහැමින් රට පාලනය කරන රජෙකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් දහයක් දීඝ නිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රයේ දැක්වෙන අතර එම පිළිවෙත් දහය දස සක්විති වත් නමින් හැඳින්වෙනබව

**දස සක්විතිවත්**

1. තම පවුලට අයත් පිරිසට දැහැමි රැකවරණය සැලසීම
2. බල සෙනඟට දැහැමි රැකවරණය සැලසීම
3. මැති ඇමතීන්ට දැහැමි රැකවරණය සැලසීම
4. බ්‍රාහ්මණ ගෘහපතියන්ට දැහැමි රැකවරණය සැලසීම
5. ගම් නියම්ගම් ජනපදවාසීන්ට දැහැමි රැකවරණය සැලසීම
6. මහණ බමුණන් සහිත පූජක උතුමන්ට දැහැමි රැකවරණය සැලසීම
7. මෘග පක්ෂීන් සහිත සත්ත්ව ප්‍රජාවට දැහැමි රැකවරණය සැලසීම
8. අපරාධ මර්දනය කරමින් අපරාධ මැඩපැවැත්වීම
9. නිර්ධනයන්ට තමා අභිමත කර්මාන්ත ආදිය සඳහා ධනය ලබාදීම
10. මදයෙන් හා ප්‍රමාදයෙන් තොර බහුශ්‍රැත මහණ බමුණන් වෙත එළඹ අවවාද අනුශාසනා ලබා රට පාලනය කිරීම

- දස සක්විති වත් ප්‍රධාන වශයෙන් කරුණු හතරක් කෙරෙහි අවධානය යොමු කර ඇතිබව

1. සියලු ජනයා ආරක්ෂා කිරීම
2. නීතිය හා සාමය ආරක්ෂා කිරීම
3. ආර්ථික සුරක්ෂිතතාව සහතික කිරීම
4. උගත් බුද්ධිමතුන් ලබා දෙන උපදෙස් අනුව රාජ්‍ය පාලනය කිරීම

**දස සක්විති වත් අනුගමනය කිරීමෙන් ජනහිතකාමී පාලන තන්ත්‍රයක් ගොඩනැගිය හැකි ආකාරය විග්‍රහ විය යුතු ය.**

**(ලකුණු 10යි.)**

4. (II) **"උපයන ධනය තම අභිවෘද්ධියට පමණක් යොදා ගැනීම බුදුසමය අනුමත නො කරයි." බෞද්ධ පරිභෝජන චින්තාව ඇසුරින් විග්‍රහ කරන්න.**

- ධාර්මිකව උපයාගත් ධනය තමාගේ මෙන්ම අන්‍යයන්ගේ ද යහපත උදෙසා බුද්ධිමත්ව යෙදවීම බුදුසමය අනුදත්බව
- උපයන ලද ධනය පරිහරණය නොකරන්නා නොකා මැරෙන්නෙකු ලෙස දක්වා ඇතිබව (අජද්දුමාරික)
- ධාර්මිකව උපයාගත් ධනය බුද්ධිමත්ව පරිහරණය කිරීම සැපයක් බව (භෝග සුඛය)
- ධනය නිසිපරිදි පරිහරණය නොකරන අසත්පුරුෂ ලෝභියා අතට පත් ධනය සිසිල් දිය පිරුණු රකුසෙක් අරක්ගත් සිසිල් දිය පිරුණු විලක් වැනිය. සත්පුරුෂයා අතට පත් ධනය පරිභෝජනය කළ හැකි සිසිල් දිය පිරුණු විලක් වැනි ය යනුවෙන් දැක්වෙනබව (පඨම අපුත්තක සූත්‍රය)
- උපයාගත් ධනයෙහි පරිත්‍යාගය හා පරිභෝජනය යන මූලික අර්ථ දෙකක් පවත්නාබව (දත්වාච භුත්වාච)

- ධාර්මික ව උපයාගත් ධනය පරිහරණය කළයුතු ආකාරය පත්තකම්ම සූත්‍රයේ සඳහන් වන බව
    1. දැහැමි ව ලැබූ භෝගයෙන් තමා සුවපත් කරයි. පිනවයි. මවුපියන්, අඹුදරුවන්, දැසිදස් කම්කරුවන්, හිතමිතුරන් සුවපත් කරයි. පිනවයි.
    2. ධනය ආරක්ෂා කිරීම සඳහා ධනය යොදවයි.
    3. ඥාති බලි, අතිථි බලි, පුබ්බපේත බලි, දේවතා බලි, රාජ බලි යන යුතුකම් ඉටුකිරීම සඳහා ධනය යොදවයි.
    4. මහණ බමුණන් විෂයයෙහි දන්දීම සඳහා ධනය යොදවයි.
- අංගුත්තර නිකායේ අණන සූත්‍රයෙහි දැක්වෙන පරිදි උපයන ධනයෙන් තමා පිනවීම, දෙමාපියන් පිනවීම, අඹුදරුවන් පෝෂණය කරවීම, හිතමිත්‍රාදීන් පිනවීම, දැසිදස් කම්කරුවන් පිනවීම හා මහන බමුණන් විෂයෙහි දක්ෂිණාව පිහිටුවීම
- උපයාගත් ධනය සමාජ සුභසාධනය සඳහා යෙදවිය යුතු බව
- උපයන ලද ධනය සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් ඉටුකිරීමට ද යෙදවිය යුතු බව
- රාසිය ගාමිණි සූත්‍රයේදී ධනය පරිහරණය පිළිබඳ උපදෙස් හතරක් පෙන්වාදී ඇතිබව
    1. දැහැමිව ඉපයීම
    2. තමා සැපවත්වීම
    3. පරිත්‍යාග කිරීම
    4. ගිජුකමින් තොරව පරිහරණය

මෙවැනි කරුණු ඇසුරෙන් පිළිතුර සකස්විය යුතු ය.

(ලකුණු 10යි.)

5. (I) නූතන සමාජයෙහි පවත්නා අධාර්මික වාණිජ ක්‍රමෝපායන් පාලනය සඳහා අදාළ කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් විස්තර කරන්න.

~~බෞද්ධ සූත්‍ර දේශනා ඇසුරෙන් හඳුනාගත හැකි~~ ය.

- අණන සූත්‍රයේ දක්වා ඇති පරිදි උත්සාහයෙන්, වීර්යයෙන්, බාහු බලය යොදවා, දහදිය වගුරුවා, ධාර්මික ව, ධාර්මික ක්‍රියා අනුගමනය කරමින්, ධනය ඉපයිය යුතුබව

"භෝගා හොන්ති උට්ඨාන විරියාධිගතා බාහාබල පරිචිතා සේදාවක්ඛිත්තා ධම්මිකා ධම්ම ලද්ධා...... "

- එහිදී ධාර්මික ධනය ඉපයීම කළ හැකි මාර්ග අතර වාණිජ කටයුතු දක්වා ඇතිබව
- වණිජ්ජා සූත්‍රයේදී වැළකිය යුතු අධාර්මික වෙළදාම් 5ක් දක්වා ඇතිබව
    1. වහලුන්, සතුන් වෙළඳාම (සත්ත වණිජ්ජා)
    2. ආයුධ වෙළඳාම (සත්ථ වණිජ්ජා)
    3. විස වෙළඳාම (විස වණිජ්ජා)
    4. මස් වෙළඳාම (මංස වණිජ්ජා)
    5. මත්ද්‍රව්‍ය වෙළඳාම (මජ්ජ වණිජ්ජා)

- වෙළඳාමේ දී නොකළ යුතු වංචනික ක්‍රියා පහක් දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ දක්වා ඇති බව

| | | |
|---|---|---|
| තුලාකූට | - | හොර තරාදි භාවිතය |
| මාන කූට | - | වංචනික ව මැනීම |
| කංස කූට | - | අගය වැඩි කොට රවටා විකිණීම |
| උක්කෝටන | - | අල්ලස් ගැනීම |
| නිකති | - | රන් රිදී නොවන දෑ එසේ යැයි කීම |

- වෙළඳාමේ දී නොකළ යුතු ක්‍රියාකාරකම් පහක් මජ්ඣිම නිකායේ මහා චත්තාරීසක සූත්‍රයේ දක්වා ඇතිබව

| | | |
|---|---|---|
| කුහණා | - | කුහක කම් කිරීම |
| ලපණා | - | තමාගේ වාසියට කතා කිරීම |
| නේමිත්තකතා | - | නිමිති කීම |
| නිප්පේසිකතා | - | ස්වාර්ථය උදෙසා අන් අයට ගැරහීම |
| ලාභේන ලාභං නිජිගිංසනතා | - | ලාභයෙන් ලාභය උපයාගැනීම ගැන කතා කිරීම |

- දක්ෂ වෙළඳුන් සතු ගුණාංග 03ක් ලක්ඛණ සූත්‍රයේ දක්වා ඇති බව

| | | |
|---|---|---|
| චක්ඛුමා | - | වෙළඳපොලේ ඉල්ලුම හා සැපයුම පිළිබඳ අවබෝධයක් ඇත්තා |
| නිස්සය සම්පන්න | - | මුදල් ආයෝජනයට හොඳ මිතුරන් සිටින්නා |
| විදුර | - | භාණ්ඩ මිලදී ගැනීමේදී, විකිණීමේදී දක්ෂ වන පුද්ගලයා |

- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වා ඇති දැහැමි ඉපයීමට අදාළ කරුණු, වෙළදාමට ද අදාළ වන බව
    1. කරන කාර්යයේ දක්ෂ වීම (දක්ඛා)
    2. අලස නොවීම (අනලසා)
    3. උපායශීලී බව (තත්‍රුපාය වීමංසා)
    4. මනා සංවිධානකරණය (අලං සංවිධාතුං)
- මල නොතලා බඹරා මලෙන් රොන් ගන්නා සේ ධර්මානුකූලව ද වේයා තුඹස බඳින්නා සේ ක්‍රමානුකූල ව ද ධනය ඉපයිය යුතු බව සිගාලෝවාද සූත්‍රයේ දක්වා තිබීම

**යනාදී කරුණු පදනම් කරගෙන පිළිතුර සකස්වීම ප්‍රමාණවත් වේ.**

**(ලකුණු 10යි.)**

**5. (II) නූතන පවුල් සංස්ථාවේ ගැටලු නිරාකරණය කරගැනීමට මංගල සූත්‍රාගත ඉගැන්වීම්වලින් ලැබෙන පිටිවහල පෙන්වා දෙන්න.**

නූතන පවුල් සංස්ථාවේ ගැටලු නිරාකරණය කර ගැනීමට අදාළ මංගල කරුණු

- අසේවනාච බාලානං - බාලයන් ඇසුරු නො කිරීම
- පණ්ඩිතානංච සේවනා - පණ්ඩිතයින් ඇසුරු කිරීම
- පූජාච පූජනීයානං - පිදිය යුත්තන් පිදීම
- පතිරූප දේස වාසෝ - සුදුසු පෙදෙසක වාසය කිරීම
- අත්ත සම්මා පණිධි - සිත මනා සේ පිහිටුවාගැනීම
- සුබාසිතා ච යාචාවා - යහපත් වචන කතා කිරීම
- මාතා පිතු උපට්ඨානං - මවුපියන්ට උපස්ථාන කිරීම
- පුත්තදාරස්ස සංගහෝ - අඹු දරුවන්ට සංග්‍රහ කිරීම

- අනාකුලා ච කම්මන්තා - නිරවුල් කර්මාන්ත කිරීම
- ඤාතකානඤ්ච සංගහෝ - ඥාතීන්ට සංග්‍රහ කිරීම
- අනවජ්ජානි කම්මානි - නිවැරදි කර්මාන්ත ඇති බව
- ආරති විරති පාපා - පාපයෙන් වැළකීම
- මජ්ජපානාච සඤ්ඤමෝ - මත් පැනින් වෙන් වීම
- සංතුට්ඨී ච - ලද දෙයින් සතුටු වීම
- කතඤ්ඤුතා - කළගුණ දන්නා බව
- ඛන්ති ච - ඉවසීම

යනාදී කරුණු නිදසුන් ලෙස දක්වමින් පිළිතුර සකස්විය යුතු යි.

(ලකුණු 10යි.)

**6. (I)** **ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු යුක්ති ගෙනහැර දක්වා, එහි ප්‍රතිඵලයක් ලෙස ධර්ම විනය සංරක්ෂණය කළ ආකාරය පැහැදිලි කරන්න.**

**ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු**

- සුභද්‍ර භික්ෂුවගේ නො මනා ප්‍රකාශය

ඇවැත්නි, කම් නැත. සෝක නො කරව්. නො වැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුනෝ වෙමු. මෙය තොපට කැප ය. මෙය තොපට නො කැප යැයි කීමෙන් උපද්‍රවයට පත්කරන ලද්දෝ වෙමු. දැන් අපි යමක් කැමති නම් එය කරන්නෙමු. යමක් නො කැමැත්තෙමු නම් එය නො කරන්නෙමු.

"අලං ආවුසෝ මා සෝචිත්ථ මා පරිදේවිත්ථ සුමුත්තා මයං, තේන මහාසමණේන උපද්දුතා ච හෝම. ඉදං වෝ කප්පති ඉදං වෝ න කප්පති. ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාම". (චුල්ලවග්ගපාළි පංචසතිකක්ඛන්ධකය)

- විසිරී පැවති ධර්මය හා විනය ඒකරාශී කරගැනීමේ අවශ්‍යතාව
- ධර්මය හා විනයෙහි අනාගත ආරක්ෂා තහවුරු කිරීමේ අවශ්‍යතාව
- දෙව්දත් තෙරුන්ගේ පංචවර ඉල්ලීම
- ඡන්න තෙරුන්ගේ අසංවර ක්‍රියාකලාපය
- ~~ආනන්ද හිමියන්ට එල්ලවූ චෝදනා~~
- නිගණ්ඨනාථපුත්තගේ අභාවයෙන් පසු අනුගාමිකයන් භේදභින්න වීම, ඡබ්බග්ගිය, සත්තරසවග්ගිය, සාති, පුනබ්බසුක, අරිට්ඨ ආදී භික්ෂූන්ගේ නොමනා ක්‍රියාකලාප
- කොසඹෑනුවර ඝෝෂිතාරාමයේදී භික්ෂූන් අතර ඇති වූ අර්බුදය

**සංගායනාවේ ප්‍රතිඵල**

- විසිරී පැවති බුද්ධ වචන ඒකරාශී කිරීම
- භාණක පරම්පරාවක් ඇති කොට ධර්මය හා විනයේ සුරක්ෂිතබව තහවුරු කිරීම
- පාරාජික පාලි, පාචිත්තිය පාලි, මහාවග්ග පාලි, චුල්ලවග්ග පාලි, පරිවාර පාලි යනුවෙන් විනය පිටකය උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට පැවරීම
- සූත්‍ර පිටකය නිකාය ග්‍රන්ථ පහක් වශයෙන් සංග්‍රහ කොට භාණක පරම්පරාවලට පැවරීම

දීඝ නිකාය - ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස
මජ්ඣිම නිකාය - සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිස
සංයුත්ත නිකාය - මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස

අංගුත්තර නිකාය - අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ භික්ෂු පිරිස
ඛුද්දක නිකාය - පොදුවේ සියලු භික්ෂූන් වහන්සේලාට

- නො පැනවූ නීති නො පැනවීමටත් පැන වූ නීති කඩ නො කොට ආරක්ෂා කිරීමටත් එකඟතාවකට පැමිණීම (ඛුද්දානුඛුද්දක ශික්ෂා පද)
- ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩය පැනවීමට නියම කිරීම ආදී ආදර්ශ මගින් භික්ෂූන් විනයානුකූල ව කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම
- ආනන්ද හිමියන්ට එල්ලවූ චෝදනා පහෙන් නිදහස් කිරීම ශාසන චිරස්ථිතියට හේතු වූ බව

(ලකුණු 10යි.)

6. (II) බුදුසසුනේ සංවර්ධනය උදෙසා පැරණි ලක්දිව පාලකයන්ගෙන් ඉටු වූ මෙහෙය අනුරාධපුර යුගයේ රජවරුන් දෙදෙනෙකුගේ ශාසනික සේවා ඇසුරින් අගයන්න.

දේවානම්පියතිස්ස රජුගේ ශාසනික සේවාව

- දේවානම්පියතිස්ස රජතුමා මිහිඳු මහරහතන් වහන්සේ පිළිගෙන පළමුවෙන්ම බුද්ධදහම වැළඳගත් රජතුමා වූ බව
- මිහිඳු මහරහතන් වහන්සේ දැකගැනීමට හා ධර්මශ්‍රවණයට රජ මිදුලට පැමිණි ජනතාවට රාජකීය ඇත්හලේ පහසුකම් සැලසීම
- මහාවිහාර සීමා පිහිටුවා මහාවිහාරය ඉදිකොට බුදුසසුනට පිදීම
- ශ්‍රී මහා බෝධිය වැඩම කරවා මහමෙවුනාවේ රෝපණය කිරීම
- භික්ෂුණී ශාසනය පිහිටුවීමට දායකවීම
- විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතිය ඇති කිරීම
- චේතියගිරියේ අටසැට ලෙන් ඉදිකර භික්ෂූන්ට වස්විසීමට පහසුකම් සැලසීම
- බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කර ථූපාරාම ස්තූපය ඉදිකිරීම
- ඉසුරුමුණි විහාරය, නාගදීපයේ ජම්බුකෝල විහාරය, තිස්සමහාවිහාරය, ප්‍රාචීනාරාමය වැනි වෙහෙරවිහාර කරවීම

දුටුගැමුණු රජුගේ සාසනික සේවාව

- පියරජු ඉදිරියේ භික්ෂූන්ට පිටු නො පාන බවට ප්‍රතිඥාදීම

"මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජසැප පිණිස නොව සම්බුද්ධ සසුනේ චිරස්ථිතිය පිණිසය" යනුවෙන් කළ ප්‍රකාශය අනුව බුදුසසුනේ චිරස්ථිතිය මුළු හදවතින් ම ප්‍රාර්ථනා කරමින් ඒ අනුව ක්‍රියා කිරීම

- රුවන්මැලි මහා සෑය, මිරිසවැටිය ආදී ස්තූප හා ලෝවාමහාප්‍රාසාදය වැනි උපෝසථාගාර මෙන්ම සංඝාරාම ඉදිකිරීම
- ලක්දිව සියලු ම භික්ෂූන් උදෙසා තුන් අවස්ථාවක තුන් සිවුරු පූජා කිරීම, ලක් රජය පස් වතාවක් බුදු සසුනට පූජා කිරීම, වෙසක් උත්සව 24ක් පැවැත්වීම හා එය අඛණ්ඩව පැවැත්විය යුතු යැයි නියම කිරීම, කඨින පූජා, අරියවංශ පූජා වැනි විවිධ උත්සව පවත්වමින් බුදුසසුනට අනුග්‍රහ කිරීම

**වළගම්බා රජුගේ ශාසනික සේවාව**

- තමා සැඟව සිටි කාලයේ උදව් උපකාර කළ කුපික්කලමහාතිස්ස හිමියන්ට අභයගිරි විහාරය කරවා පූජා කොට එහි අභිවෘද්ධියට ක්‍රියා කිරීම
- දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරාරාම ඉදිකිරීමෙන් බෞද්ධ සංස්කෘතියේ සංවර්ධනයට දායක වීම
- රටපුරා බොහෝ ලෙන් විහාර කරවා පූජා කිරීම

**මහසෙන් රජුගේ සාසනික සේවාව**

- ජේතවන විහාරය ඉදිකොට පූජා කිරීම
- දක්ඛිණගිරි විහාරය කරවා භික්ෂූන්ට පූජාකළ බව

**ආදී අනුරාධපුර යුගයට අයත් රජවරුන් දෙදෙනෙකුගේ ශාසනික සේවා ඇසුරින් පිළිතුර සකස් විය යුතු ය.**

**(ලකුණු 10යි.)**

**7. (I) සාම්ප්‍රදායික ථායි සංස්කෘතියේ පෝෂණයට බුදුසමයෙන් ලැබුණු ආලෝකය නිදසුන් මගින් ප්‍රකට කරන්න.**

- රජු බෞද්ධයෙකුවීම හා බුදුසසුන ආරක්ෂා කිරීම තඩත්තු කිරීම රජයේ යුතුකමක් සේ සැලකීම
- ථායි පිරිමින් ටික කලකට හෝ පැවිදි වී සිටීම චිරාගත සම්ප්‍රදායයක් වන අතර පැවිදි වීම හා උපැවිදි වීම උත්සවශ්‍රීයෙන් සිදුකිරීම මෙන්ම තාවකාලික පැවිද්දේ දී හමුවන සහතිකය විවාහ වීමේ දී හා රැකියා ලැබීමේ දී විශේෂ සුදුසුකමක් සේ සැලකීම
- දිනපතා උදෑසන පිණ්ඩපාතය පූජාකිරීම
- ථායි ජනතාව දෛනික ව ආගමික කටයුතුවල නිරත වීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස් කරගෙන එම පූජා කටයුතුවල නිරත වීම
- ලොකු කුඩා සෑම අයෙකුගේ ම ගෙලෙහි බුද්ධ රූපයක් පැළඳ සිටීම
- වාර්ෂිකව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවයට හා කඨින පිංකමට ප්‍රමුඛත්වය හිමිවීම
- අධ්‍යාපනය, කලාශිල්ප හා සාහිත්‍යය බුද්ධදහමින් පෝෂණය වී තිබීම
- ආරාමය ගමේ ප්‍රජා මධ්‍යස්ථානය හා අධ්‍යාපන මධ්‍යස්ථානය වීම
- උපතේ සිට මරණය දක්වා ජීවිතයෙහි වැදගත් අවස්ථාවලදී භික්ෂූන්ගේ ආශිර්වාදය ලබාගැනීම
- බුදුදහමේ ඉගැන්වීම් ඇසුරෙන් තම ජීවිතය හැඩගස්වා ගැනීම හා ඉවසීම, පරිත්‍යාගශීලී බව, කරුණාව ආදී ගුණ ධර්මයන්ගෙන් යුක්තවීම

**(ලකුණු 10යි.)**

**7. (II) පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා සිදු කෙරෙන චාරිත්‍ර විධි විෂයයෙහි බෞද්ධාභාසය ලැබී ඇති අයුරු පරීක්ෂා කරන්න.**

- පුද්ගල ජීවිතයෙහි උපතේ සිට මරණය දක්වා සෑම වැදගත් අවස්ථාවක ම ආගමික චාරිත්‍රවලට අනුකූලව සිදුකිරීම
- දරු සම්පත් අපේක්ෂා කරන කාන්තාවන් විහාරස්ථානයට ගොස් තෙරුවන් වැඳ, දෙවියන්ට පින් දී තමාට පින්වත් දරු සම්පතක් ලැබේවායි ප්‍රාර්ථනා කිරීම
- දරුවා මව්කුසට පිළිසිඳගත් දින සිට ප්‍රසූතියට ආසන්න වන තෙක් ම විවිධ ආගමික වතාවත්වල නියැලීම
- දරුවා බිහිවීමට ආසන්න කාලයේදී අංගුලිමාල පිරිත දේශනා කරවාගෙන ආශිර්වාද ලබාගැනීම

- නිසි කලට දරුවාගේ ආරක්ෂාව පිණිස රත්නසූත්‍ර සංග්‍රහය, ධර්ම චක්‍රය, බෝ පත්‍රය ආදිය ගෙලෙහි පැළඳවීම
- බෞද්ධ පුද සිරිත් පවත්වමින් අඳුල්කටගෑම
- භික්ෂූන් වහන්සේ හෝ වෙනත් වැඩිහිටියකු ලවා අකුරු කියවීම
- ආවාහ විවාහ කටයුතුවල දී ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලබාගැනීම
- අවමංගල්‍ය අවස්ථාවල දී බෞද්ධ චාරිත්‍ර ධර්මවලට අනුව භික්ෂූන් වහන්සේලා වැඩම කරවා මතකවස්ත්‍ර පූජා කිරීම, අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම ශ්‍රවණය කරවා පැන් වඩා පින් අනුමෝදන් කිරීම ආදි චාරිත්‍ර පැවැත්වීම

(ලකුණු 10යි.)

8. (I) ශ්‍රී ලාංකේය ස්තූප කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ විචාරාත්මක විවරණයක් කරන්න.

- ලක්දිව ස්තූප නිර්මාණයේ ආරම්භය ක්‍රි.පූ. 06 වන සියවස තෙක් ඈතට දිව යන බව
  උදා: ගිරිහඬු සෑය, මහියංගන, නාගදීපය හා කැලණිය යන ස්තූප
- ලංකාවේ ඉපැරණිම ස්තූපය ලෙස ථූපාරාමය සැලකෙන බව
- මහාවංසයේ සඳහන් පරිදි දෙවනපෑතිස් රජතුමා යොදුනෙන් යොදුන ස්තූප ඉදිකළ බව උත්තිය රජු විසින් මිහිඳු මා හිමියන්ගේ භෂ්මාවශේෂ තැම්පත් කොට අම්බස්තල ස්තූපය ගොඩනැංවූ බව කාවන්තිස්ස රජු කරවූ සේරුවාවිල ස්තූපය, කැලණිතිස්ස රජු කරවූ කැලණි ස්තූපය, දුටුගැමුණු රජු ඉදිකළ මිරිසවැටි දාගැබ, රුවන්මැලි මහා සෑය, සද්ධාතිස්ස රජු කරවූ යුධගනා හා දීඝවාපි ස්තූප ද වළගම්බා රජු කරවූ අභයගිරිය හා මහසෙන් රජු කරවූ ජේතවන ස්තූපය පැරණි ලක්දිව ප්‍රකට අනුරාධපුර යුගයට අයත් ස්තූප බව
- කිරි වෙහෙර, පබලුවෙහෙර, මැණික් වෙහෙර, දෙමළ මහා සෑය, රන්කොත් වෙහෙර, සත්මහල් ප්‍රාසාදය ආදිය පොළොන්නරු යුගයට අයත් ස්තූප ලෙස සැලකෙන බව
- ලක්දිව ස්තූප විකාශයේ දී එහි ආකෘතිමය වෙනස්කම් ඇති බව

  1. ධාන්‍යාකාර - කැළණි ස්තූපය
  2. බුබ්බුලාකාර - රුවන්මැලි සෑය
  3. ඝන්ටාකාර - ථූපාරාමය, ලංකාරාමය, මහියංගන ස්තූපය
  4. ඝටාකාර - කතරගම කිරි වෙහෙර, සෝමාවතී ස්තූපය,
  5. ආමලකාකාර - දැදිගම කොටවෙහෙර
  6. පද්මාකාර - දෙමළ මහා සෑය, යුදගනා ස්තූපය

- ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණයේ ආකෘතිය ඉන්දියාවේ සාංචි ස්තූපය පූර්වාදර්ශ කරගෙන තිබුණ ද එහි ශ්‍රී ලාංකේය අනන්‍යතා ලක්ෂණ රැසක් විද්‍යමාන වන බව
  උදා: තුන්මහල් පේසාව, හස්තිවේදිය, මද්ද වේදිය, දේවතා කොටුව, කොත්කැරැල්ල, කොත, චූඩාමාණික්‍ය ආදී අංග එක්වීම
- ස්තූපයේ හා බැතිමතුන්ගේ ආරක්ෂාව සඳහා චෛතිඝර ඉදිවූ බව
- ස්තූප විකාශයේදී ථූපයට අලංකාරවත් බව එක්කිරීම සඳහා වාහල්කඩ, මළසුත් ගෙවල්, සලපතල මළුව, ඇත්පවුර, මකර තොරණ, පුන්කලස්, පියගැටපෙළ, කොරවක්ගල්, මුරගල්, සඳකඩපහණ, වැලි මළුව ආදී ලාංකේය ස්තූප කලාවට ආවේණික අංග එකතුවීම
- ක්‍රමයෙන් විකාශය වූ ලාංකේය ස්තූප නිර්මාණය මූලිකාංග 07 කින් සමන්විත වූ බව
  1. පදනම
  2. තුන්මහල් පේසාව
  3. ගර්භය
  4. හතරැස් කොටුව
  5. දේවතා කොටුව
  6. කොත් කැරැල්ල

7. කොත (කොත මුදුනේ චූඩා මාණික්‍ය)

- ලාංකේය ස්තූපය කලාත්මක බවින් මෙන්ම දාර්ශනික අගයෙන් ද යුක්ත වන බව
- ස්තූපාංග මගින් බුද්ධදහමට අදාළ ධර්ම කොටස් විවරණය කෙරෙන බව ඒ අනුව,

| | | |
|---|---|---|
| 1. පදනම | - | සුවාසූදහසක් ධර්මස්කන්ධය |
| 2. තුන්මහල් පේසාව | - | ත්‍රිවිධරත්නය |
| 3. ගර්භය | - | සත්තිස් බෝධිපාක්ෂික ධර්ම |
| 4. හතරැස් කොටුව | - | චතුරාර්ය සත්‍යය |
| 5. දේවතා කොටුව | - | දිව්‍යලෝක හෝ සතරවරම් දෙවිවරු |
| 6. කොත් කැරැල්ල | - | නවාංග ශාස්තෘශාසනය |
| 7. කොත | - | නිවන |

(ලකුණු 10යි.)

8. (II) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විස්තර සපයන්න.

(1) ශුද්‍ර වර්ණය

(2) සතර අගති

(3) අභයගිරිය

(4) සඳකඩපහණ

(1) ශුද්‍ර වර්ණය

- බ්‍රාහ්මණ නිර්මාණවාදී සංකල්පයට අනුව ශුද්‍ර වර්ණය පහත් යැයි සම්මත කර තිබීම
- ස්වධර්ම සංකල්පයට අනුව උසස් යැයි සම්මත කුලයන්ට බැලමෙහෙවර කිරීම ඔවුන්ගේ කාර්ය ලෙස සැලකීම
  ඒක මේවතු ශුද්‍රස්‍ය - ප්‍රභුඃ කර්ම සමාදිසත්
  ඒතේසාමේව වර්ණානාං - සුශ්‍රූසා මනුසුයසා
- අන් කුලවලට සාපේක්ෂව ආර්ථික, දේශපාලන, ආගමික, අධ්‍යාපනික හා සාමාජික යන සෑම ක්ෂේත්‍රයක ම අයිතිවාසිකම් අහිමිකර තිබීම
- නීතිය ඉදිරියේ සියලු දෙනා සමාන වුවත් ශුද්‍රයාට එම අයිතිය ද අහිමි වූ බව
- යම් වරදක් කළවිට ශුද්‍රයාට දරුණු දඬුවම් නිර්දේශ වූ බව
  - බ්‍රාහ්මණයෙකුට පරුෂ වචනයෙන් ආක්‍රෝෂ පරිභව කළහොත් දිව කැපිය යුතු ය.
  - බ්‍රාහ්මණයන්ට ධර්මය ගැන උපදෙස් දෙන ශුද්‍රයාගේ මුවෙහි හා දෙකන්වල උණු ලාකඩ වත්කළ යුතු ය.
  - බ්‍රාහ්මණයෙකුට එරෙහි ව අත හෝ පාදය එසවූයේ නම් එම අවයවය කපා දැමිය යුතු ය.
  - බ්‍රාහ්මණයෙකුට කෙළ ගැසුව හොත් දෙතොල කැපීම, මුත්‍රා කළහොත් ලිංගය කැපීම, අධෝවාතය පිටකළ හොත් ගුදය කැපීම කළයුතු බව
- ශුද්‍රයන් බහුල ව වාසය කරන දේශය සාපලත් දේශයක් සේ සැලකූ බව
- ශුද්‍රයන්ට උපනයනය තහනම් බව හා වේදපාඨ ගායනය හෝ ශ්‍රවණය කිරීම තහනම් වූ බව
- ශුද්‍ර වංශිකයන්ට කිසිදු අධ්‍යාපන අයිතියක් හිමි නො වීම
- ධනය රැස්කිරීම හෝ ලඟ තබාගැනීම සම්පූර්ණයෙන් ම තහනම් කර තිබීම

## (2) සතර අගති

ඡන්දා දෝසා භයා මෝහා - යෝ ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසෝ - කාලපක්ඛේව චන්දිමා
(දීඝ නිකාය ၊ සිගාලෝවාද සූත්‍රය)

- ඡන්ද, ද්වේෂ, භය, මෝහ යනු සතර අගති බව
- ඡන්දය යනු කැමැත්තයි. එය අගතියක් වන්නේ ඒ තුළින් නො මග ගොස් මධ්‍යස්ථ ව සාධාරණය ඉටු නො කර තම කැමැත්තට අනුව කටයුතු කිරීමෙන් බව
- ඡන්දයෙන් අගතියට ගිය විට තමන් සිත්ගන්නා අයට වාසි වන පරිදි තීරණ ගැනීමට හා විවිධ වරදාන වරප්‍රසාද ලබාදීමට පෙළඹෙන බව
- ද්වේෂය යනු තරහයි. ද්වේෂයෙන් දූෂිත වූ මනෝභාව ඇති ඕනෑම අයෙකු යුතුකම්, සුදුසුකම්, සාරධර්ම පිළිබඳව නිවැරදි අවබෝධයක් නැතිව තීරණ ගන්නා බව
- ද්වේෂයෙන් යුතුව ගනු ලබන තීරණ නිසා පළිගැනීම, අසාධාරණ ලෙස දඬුවම් පැමිණවීම ආදී ක්‍රියාකාරකම්වලට යොමු වන බව හා එය ද්වේෂයෙන් අගතිගාමී වීමක් බව
- භය යනු බියගුලු බවයි. එය පුද්ගලයාගේ ස්වාධීනත්වයට බාධා පමුණුවන බව හා බලවතෙකුට බියේ ඔහුට පක්ෂ වන තීරණ ගන්නා බව
- පාලකයකු මෙන්ම ඕනෑම සමාජ තත්ත්වයකට අයත් පුද්ගලයෙකු බිය කරණකොට ගෙන වැරදි ක්‍රියාවන්ට පෙළඹෙන බව
- මෝහය යනු මුලාවයි. පුද්ගලයා මුලාව නිසා අගතිගාමී වේ. එය පුද්ගලයා වැරදි ක්‍රියාවන්ට යොමුකරන ප්‍රබල සාධකයක් වන බව
- මෝහය නිසා සත්‍යය හා යථාර්ථය නො වැටහේ. එම නිසා නිවැරදි තීන්දු තීරණවලට එළඹීමට නො හැකි වන බව

ල 5

## (3) අභයගිරිය

- වට්ටගාමිණී අභය රජු දෙවනවර බලයට පත්වීමෙන් අනතුරුව ගිරිනිඝණ්ඨාරාමය බිඳදමා එම ස්ථානයේ ගොඩනැගූ කුපික්කලතිස්ස හිමියන්ට පූජාකළ ආරාමය අභයගිරිය ලෙස ප්‍රකට වූ බව
- මෙය අභයුත්තර විහාරය, උත්තර විහාරය යන නම්වලින් ද හැඳින්වෙන බව
- පසුව ඉදිකළ සෝමාරාමය, දක්ෂිණගිරිය විහාරය, සාලියාරාමය අභයගිරි සම්ප්‍රදායට අයත් වූ බව
- අභයගිරිය වජ්ජිපුත්තක නිකායට අයත් ධර්මරුචි හිමිගේ අදහස් පිළිගෙන ක්‍රියාත්මක වූ බැවින් ධම්මරුචි සම්ප්‍රදාය ලෙස ද හැඳින්වෙන බව
- වජ්ජිපුත්තක හා වෛතුල්‍යවාදී මත ඉදිරිපත් කරමින් මහායානික අදහස් සමාජගත කිරීමට අභයගිරිය දායක වූ බව
- ප්‍රතිපත්ති පූජාවට වඩා ආමිස පූජාවට මුල්තැනක් ලබාදීම
- බෝධිසත්ත්ව සංකල්පය සමාජගත කිරීම
- ජය පිරිත, සිවලී පිරිත, ගිනි පිරිත, ජලනන්දන පිරිත, දළදා පූජාව හා පෙරහැර ආදී පුදපූජා ක්‍රම හඳුන්වාදීම

- භක්තිවාදය ප්‍රචලිත කිරීම තුළින් පූජා සංස්කෘතියක් හඳුන්වාදීම
  - බෝධියට නානුමුර පැවැත්වීම
  - බෝධිසත්ත්ව ප්‍රතිමාවලට රාජාභරණ පැළඳවීම
  - බුද්ධරූප අභිෂේක කිරීම
- කලාත්මක ක්ෂේත්‍රයේ වර්ධනයට කටයුතු කළ බව
  - අලංකාර ගෘහ නිර්මාණ, මූර්ති කැටයම් පොකුණු ආදිය නිර්මාණය කිරීම
  - රත්නප්‍රාසාදය වැනි අලංකාර විහාර මන්දිර ඉදිකිරීම
  - සුවිශාල දානශාලා ඉදිවීම
  - කලාත්මක බවින් අනූන බුද්ධ ප්‍රතිමා නිර්මාණය වීම
  - අලංකාර සඳකඩපහන, පොකුණු නිර්මාණය වීම
- ග්‍රන්ථ රචනා කිරීම
  - විමුක්ති මාර්ගය
  - සද්ධම්මෝපායනය වැනි ග්‍රන්ථ
- මහායාන ග්‍රන්ථ තැන්පත් කිරීමට ධාරණී ගෘහ නිර්මාණය කළ බව
- පුරාවිද්‍යාව, වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යෝතිෂය, ගෘහනිර්මාණ ශිල්පය වැනි ලෞකික විෂය ධාරා උගන්වන ආයතනයක් වූ බව
- මූලායතන මගින් අධ්‍යාපන කටයුතු සංවර්ධනය කළ බව
  - උත්තර මූල

  විජයබා රජු ද්‍රවිඩන් සමග කළ සටනේදී අභයගිරිය උදව් කළ නිසා උත්තර මූල විහාරය කරදුන් බව
  - මහනෙත්පා මූල

  මහානේත්‍රප්‍රාසාද මූලය සිවුවන අග්ගබෝධි රජු විසින් ඉදිකළ බව
  - කපාර මූල

  දෙවන දාඨෝපතිස්ස රජු දවස ආරම්භ වූ බව
  - වහදුම මූල

  පස්වැනි අග්බෝ රජු ධර්මරුචි නිකායිකයන්ට කරදුන් බව

ල 5

(4) **සඳකඩපහණ**

- මුල්කාලයේ බෞද්ධ ගොඩනැගිලිවලට ප්‍රවේශවීමට ඇති පියගැටපෙළ පාමුළ තිබූ අර්ධ කවාකාර ගල්පඩිය සඳකඩපහණ නමින් හැඳින්වූ බව
- හෙළකලාකරුවාගේ විශිෂ්ඨතම නිමැවුම් අතර සඳකඩපහණට ප්‍රමුඛත්වයක් හිමිවන බව
- ඉන්දියාවේ පාඨිකා නමින් හැඳින්වූ සඳකඩපහණ ලංකාවේ අඩ්ඪචන්ද පාසාණ, පදගන්ඨිකා යන නම්වලින් ද හැඳින්වෙන බව
- "පාසානස්ස හෙට්ඨං අඩ්ඪචන්ද පාසාණං" යන අටුවා පාඨයට අනුව මෙය අර්ධ චන්ද්‍ර ආකෘතියකින් යුක්තවූ බව
- අඩසඳපහණ යන්න පද පෙරළියෙන් සඳකඩපහණ වශයෙන් සකස්වී ඇති බව
- ඉන්දියාවේ නාගාර්ජුන කොණ්ඩ, අජන්තා විහාරය යන ස්ථාන කිහිපයක සඳකඩපහණ දක්නට ලැබුන ද ඒවා ලාංකේය සඳකඩපහණ තරම් කලාත්මක බවින් උසස් නො වන බව
- ලාංකේය සඳකඩපහණ ආරම්භක වකවානුවේ කැටයම් විරල චාම් එකක් වූ අතර ක්‍රමයෙන් එයට කැටයම් එකතු වී ඇති බව
- අනුරාධපුර බිසෝමාලිගාව අසල පිහිටි සඳකඩපහණ හා රත්නප්‍රාසාදයෙහි සඳකඩපහණ කලාත්මක අතින් අනූන බව
- අනුරාධපුර යුගයේ සඳකඩපහණට වඩා පොළොන්නරු හා මහනුවර යුගවල සඳකඩපහනෙහි වෙනස්කම් දැකිය හැකි බව
- බෙල් මහතාගේ අදහසට අනුව එහි එක් පෙළට ගමන් කරන සතුන් හතර දෙනාගෙන් සතර දිශාව සංකේතවත් කරන බව
- සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව එයින් භව චක්‍රය සංකේතවත් වන බව
- පිටරවුමේ පිහිටි පළාපෙති මෝස්තරයෙන් සත්ත්වයා රාග, ද්වේෂ, මෝහ ආදී කෙළෙස් ගින්නෙන් දැවෙන බව
- සතුන් හතර දෙනාගෙන්

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

- ඇතා - ජාති
- අශ්වයා - ජරාව
- සිංහයා - ව්‍යාධිය
- ගවයා - මරණය ආදී වශයෙන් සතර භය සංකේතවත් කරන බව
- ලියවැලෙන් තෘෂ්ණාව සංකේතවත් කරන බව
- හංසාවලිය පිවිතුරු බව සංකේතවත් කරන බව
- නෙලුම් මලින් බ්‍රහ්මාවාස / නිර්වාණ

- ඩී.ටී. දේවේන්ද්‍ර මහතාට අනුව සඳකඩපහණ ගොඩනැගිලි දොරටු සැරසීමට යොදාගත් උපායත් හා පාදෝණි ලෙස දැක්විය හැකි බව
- මහාචාර්ය විනී විතාරාණ මහතාට අනුව සඳකඩපහණ සූර්ය හා චන්ද්‍ර යන දෙදෙනා පිළිබඳ විශ්වාසයට ද එහි සංකේතය සශ්‍රීකත්වයට සම්බන්ධ වෙයි.
- විලියම් ඊ. වෝඩ් මහතාගේ අදහසට අනුව සඳකඩපහණ ආශ්‍රමයක හෝ විහාර මන්දිරයක හෝ ප්‍රාසාදයක හෝ පළමු පියගැටය සමග යාවී ඇති හෙයින් එහි මැද ඇති විකසිත නෙලුම්පත් රටාව ශුද්ධ ස්ථානයකට ඇතුලු වීමේදී බැතිමතුන්ගේ ආත්ම පූජාවෙන් කොටසක් සංකේතවත් කරන බව කියයි. ⓑ ⑤

(ලකුණු 05 x 2=10යි.)

**************

PAST PAPERS WIKI

(30) WWW.PastPapers.WiKi (30)